# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 නොවැම්බර් මස 04 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 නොවැම්බර් මස 07 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 65.00 යි. තැපැල් ගාස්තුව : රු. 70.00 යි.

# 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත

[සහතිකය සටහන් කළේ 2014 නොවැම්බර් මස 04 වැනි දින]

**එල්.ඩී.—ඕ 39/2011**

**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය පිහිටුවීම සඳහා ද; ජාතික සංවර්ධන අවශ්‍යතා උදෙසා න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය උපයෝගි කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම සඳහා ද; ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව පිහිටුවීම සඳහා ද; අයනීකාර විකිරණ සහ ප්‍රභවයන්ගේ සුරක්ෂිතතාවය සහ ආරක්ෂාව සම්බන්ධිත ක්‍රියා පිළිවෙත් නියාමනය කිරීම සඳහා ද; න්‍යෂ්ටික ආයුධ තහනම් කිරීම සහ ආරක්ෂණය තහවුරු කිරීම සඳහා ද; 1969 අංක 19 දරන පරමාණුක බලශක්ති අධිකාරිය පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධි විධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

පූර්විකාව.

ශ්‍රී ලංකාව ඇතුළත ජාතික සංවර්ධනය සඳහා සෞඛ්‍ය, කර්මාන්ත, පාරිසරික සහ කෘෂිකර්මය සම්බන්ධයෙන් න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණයේ යහපත් සහ සාමකාමී යොදාගැනීම්වලට අවසර දීම අවශ්‍ය වී ඇති හෙයින් ද:

අයනීකාර විකිරණ හා සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා ප්‍රමිතීන් පිළිගැනීම, බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රම වේදය, සෝදිසි කිරීම් සහ ක්‍රියාත්මක කිරීම් ඇතුළත් නියාමන පාලන ක්‍රමයක් පිහිටුවීම සහ පවත්වා ගෙන යාම මගින් විකිරණ ප්‍රභවවල ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය සහ විකිරණ අයනීකරණය මඟින් විභව්‍ය විය හැකි හානිකර බලපෑමෙන් වර්තමානයේ මෙන්ම අනාගතයේ දී ද පුද්ගලයන්, සමාජය හා පරිසරය සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් සැලසීමට අවශ්‍ය වී ඇති හෙයින් ද:

න්‍යෂ්ටික බලශක්ති ක්ෂේත්‍රයෙහි ශ්‍රී ලංකාව ඇතුළත්ව සිටින අදාළ ජාත්‍යන්තර සම්මුති, විශේෂයෙන්ම න්‍යෂ්ටික ආයුධ ව්‍යාප්ත නොකිරීම පිළිබඳ සම්මුතිය සහ ආරක්ෂණ ගිවිසුම් යටතේ ස්වකීය බැඳීම් ඉටුකිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුවට අවශ්‍ය වී ඇති හෙයින්ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

### I වන පරිච්ඡේදය

### ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය පිහිටුවීම

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය පිහිටුවීම.

**2.** (1) ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) 6 වන වගන්තියේ සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත, අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන්, අවිච්ඡින්න පැවැත්මක් ඇති හා පොදු මුද්‍රාවක් තබාගත හැකි සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ මණ්ඩලය විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ අරමුණු.

**3.** මණ්ඩලයේ අරමුණු වනුයේ-

(අ) න්‍යෂ්ටික තාක්ෂණයේ සාමකාමී යොදාගැනීම් ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම සහ ඒ තාක්ෂණය උපයෝගී කරගෙන සේවා සැපයීම;

(ආ) ජාතික අරමුණු සාක්ෂාත් කරගැනීමේ කාර්ය සඳහා න්‍යෂ්ටික විද්‍යාව සහ න්‍යෂ්ටික තාක්ෂණය පිළිබඳ සාමකාමී යොදාගැනීම් සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම;

(ඇ) න්‍යෂ්ටික තාක්ෂණයේ සාමකාමී යොදාගැනීම්වල ප්‍රවේසම් සහිත බව සහ සුරක්ෂිත ක්‍රම සහ ගුණත්වය තහවුරු කිරීම සඳහා වූ නව ක්‍රමෝපක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ ඒවාට ආධාර කිරීම;

(ඈ) න්‍යෂ්ටික යොදාගැනීම් සම්බන්ධයෙන් නියාමන අවශ්‍යතා ඉටුකිරීම පිණිස විකිරණ ආරක්ෂාව සඳහා වන සේවා සැපයීම;

(ඉ) වාණිජ හෝ වෙනත් කාර්ය සඳහා අයනීකාර විකිරණ සහ අනුපූරක තාක්ෂණ සම්බන්ධිත ක්‍රියාකාරකම්වල නිරත වීම.

මණ්ඩලයේ කාර්ය සහ කර්තව්‍ය.

**4.** මණ්ඩලයේ කාර්ය සහ කර්තව්‍ය වනුයේ-

(අ) වෛද්‍ය, පාරිසරික, කාෂිකාර්මික, කාර්මික සහ වෙනත් සාමකාමී කාර්ය සඳහා සහ ජාතික සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි පරිදි විද්‍යාත්මක සහ තාක්ෂණික

සුගමනය සඳහා අනුපූරක තාක්ෂණය සහිතව හෝ අන්‍යාකාරයෙන් විකිරණශීලී ද්‍රව්‍ය සහ අයනීකාර විකිරණ උපයෝගී කර ගැනීම;

(ආ) අනුපූරක තාක්ෂණය සමග හෝ අන්‍යාකාරයෙන් අයනීකාර විකිරණ යොදාගැනීම සම්බන්ධව පර්යේෂණ පැවැත්වීම;

(ඇ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සහ වෙනත් අදාළ ආයතනයක නිලධරයන් සඳහා උචිත පුහුණු කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පහසුකම් සහ වැඩපිළිවෙල සපයා ඇති බව සහතික කිරීම;

(ඈ) න්‍යෂ්ටික තාක්ෂණය හෝ වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය උපයෝගි කර ගැනීම පිළිබඳ තොරතුරු මණ්ඩලය වෙත ඇති විට සහ ඉල්ලීමක් කරනු ලැබ උචිත යැයි මණ්ඩලය සලකන විට යම් අදාළ රජයේ ආයතනයකට හෝ යම් ජාතික හෝ ජාත්‍යන්තර රාජ්‍ය නොවන ආයතනයකට හෝ මහජනයාට එම තොරතුරු ලබාදීම;

(ඉ) අනුපූරක ක්‍රම සහිතව හෝ අන්‍යාකාරයෙන් අයනීකාර විකිරණ යොදාගැනීම සම්බන්ධයෙන් ආධාර කිරීම පිණිස වෘත්තික සංවිධාන හෝ සමිති පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම සහ ලබාදිය හැකි සම්බන්ධිත සේවා සැපයීම;

(ඊ) න්‍යෂ්ටික තාක්ෂණය, විකිරණවේදී යොදාගැනීම් සහ වෙනත් අදාළ අංශයන් සම්බන්ධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ මධ්‍යස්ථාන, පර්යේෂණාගාර සහ නියමු යන්ත්‍රාගාර ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(උ) විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය සහ බැහැරකිරීම හා විකිරණශීලී සමස්ථානික නිෂ්පාදනය සහ බෙදාහැරීම සඳහා කාර්මික අනුආයතන හෝ පහසුකම් ඉදිකිරීම සහ ක්‍රියාත්මත කිරීම;

(ඌ) න්‍යෂ්ටික තාක්ෂණය, පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා වන අයුරින් සාමකාමීව යොදාගැනීම සංවර්ධනය කිරීමෙහිලා ආධාර කිරීම;

(එ) ශ්‍රී ලංකාව ඇතුළත පිහිටි විකිරණශීලී ඛණිජ සම්පත්වල පැවැත්ම ගවේශණය කිරීම;

(ඒ) මණ්ඩලයේ අරමුණු ඉටුකරගැනීමට උපකාරී වෙතැයි සලකන දේශීය හෝ ජාත්‍යන්තර ආයතන හෝ සංවිධාන සමග විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතාව ඇතිකර ගැනීම, පවත්වා ගැනීම සහ වර්ධනය කිරීම;

(ඔ) අයනීකාර විකිරණ හෝ වෙනත් අනුපූරක තාක්ෂණ සම්බන්ධිත වාණිජ සහ වෙනත් ව්‍යවසායයන් සඳහා ඇතුළත් වීම;

(ඕ) මණ්ඩලයේ කාර්ය සහ කර්තව්‍ය කිරීමට සහ ඉටුකිරීමට අදාළව තොරතුරු අමාත්‍යවරයාට සැපයීම; සහ

(ක) මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කරගැනීමට අවශ්‍යයයි මණ්ඩලය සලකන වෙනත් කාර්ය සහ කර්තව්‍ය කිරීම සහ ඉටුකිරීම.

මණ්ඩලයේ බලතල.

**5.** මේ පනතින් මණ්ඩලයට ප්‍රකාශිතවම පිරිනැමෙන බලතලවලට අමතරව මණ්ඩලයේ කර්තව්‍යයන් සාර්ථකව කිරීම සහ ඉටුකිරීම සඳහා පහත සඳහන් කටයුතු කිරීමේ බලය ද මණ්ඩලය සතු විය යුතු ය :-

(අ) මණ්ඩලයේ කර්තව්‍ය කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අවශ්‍ය පර්යේෂණාගාර, පුස්තකාල, වැඩපොලවල් සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, සම්පාදනය කිරීම සහ පවත්වාගෙන යාම;

(ආ) මණ්ඩලයේ කර්තව්‍යවලට අදාළ හෝ සම්බන්ධ කවර හෝ විෂයයක් පිළිබඳ වාර්තා, වාර ප්‍රකාශන සහ ලේඛන රැස්කිරීම, මුද්‍රණය කිරීම සහ ප්‍රකාශනය කිරීම;

(ඇ) මණ්ඩලයේ අරමුණුවලට සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සමාන අරමුණු සහිත ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ඇති ආයතන සමග සහයෝගීතාව සඳහා වූ ගිවිසුම්වලට අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව ඇතුළත්වීම;

(ඈ) යම් ද්‍රව්‍යයක, වෙළඳ භාණ්ඩයක හෝ වස්තුවක විකිරණශීලී අපවිත්‍රතා සහ අයනීකාර විකිරණ මට්ටම් නිශ්චය කිරීම පිණිස පරීක්ෂණ සේවා ලබාදීම;

(ඉ) ක්‍රමාංකන සේවා සහ විකිරණය මැනීමේ උපකරණ සඳහා සේවා සහ මාත්‍රාමිතික සේවා ලබාදීම;

(ඊ) අයනීකාර විකිරණ නිපදවීම හෝ උපයෝගීකර ගැනීම සඳහා හෝ යම් පර්යේෂණයක් සඳහා අවශ්‍ය වන හෝ අවශ්‍ය විය හැකි බව මණ්ඩලයේ මතය වන යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම, මිළදී ගැනීම; ආනයනය කිරීම හෝ අත්කර ගැනීම, ගබඩා කිරීම, විකිණීම, ප්‍රවාහනය කිරීම හෝ අපනයනය කිරීම සහ එවැනි යම් භාණ්ඩයක් බැහැර කිරීම;

(උ) මණ්ඩලය හැර වෙනත් යම් ආයතනයක් හෝ තැනැත්තකු විසින් මෙහෙයවනු ලබන හෝ කරනු ලබන යම් පර්යේෂණයක් සම්බන්ධයෙන් පාවිච්චි කිරීම සඳහා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට මණ්ඩලයට අයත් යම් උපකරණයක් හෝ පහසුකම් ලබාදීම;

(ඌ) මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් වී නොමැති හෝ අයිතිකරුවකු සොයාගත නොහැකි යම් විකිරණශීලී ප්‍රභවයක හෝ විකිරණශීලී අපද්‍රව්‍යයක ප්‍රවේසම් සහිත බව සහ සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස, ඒ පිළිබඳ තොරතුරු ලැබුනු විට, ප්‍රමාණවත් පියවර ගැනීම;

(එ) න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය, විකිරණශීලී ද්‍රව්‍ය සහ සම්බන්ධිත කරුණු සම්බන්ධව තොරතුරු ප්‍රචලිත කිරීම සහ පුද්ගලයන් පුහුණුකිරීම;

(ඒ) න්‍යෂ්ටික විද්‍යා සහ තාක්ෂණය, අයනීකාර විකිරණ හෝ විකිරණශීලී ද්‍රව්‍ය සහ වෙනත් අදාළ කරුණු පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා විශ්වවිද්‍යාල, රජයේ දෙපාර්තමේන්තු සහ ශ්‍රී ලංකාව ඇතුළත හා ඉන් පිටත වෙනත් ආයතන හෝ තැනැත්තන් සමග සැළසුම් සැකසීම;

(ඬ) මණ්ඩලයේ විද්‍යාඥයන්ට, ඉංජිනේරුවන්ට, තාක්ෂණික කාර්ය මණ්ඩලිකයන්ට සහ සෙසු සේවා නියුක්තයන්ට කාර්ය සාධනය පදනම් කර ගත් අනුබල ප්‍රතිලාභ මුදල් විෂයයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සකස් කරන ලද යෝජනා ක්‍රම අනුව ප්‍රදානය කිරීම;

(ඕ) මණ්ඩලයේ යම් කාර්ය සහ කර්තව්‍ය, මණ්ඩලයේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයෙකුට හෝ මණ්ඩලයේ අධ්‍යක්ෂ - ජනරාල්වරයාට පවරා දීම;

(ක) චංචල හා නිශ්චල දේපළ අත්කර ගැනීම හා දැරීම සහ ඒ දේපළ විකිණීම, බදු දීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම;

(ග) බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සහ මණ්ඩලයේ මුදල් යම් බැංකුවක තැන්පත් කිරීම සහ මණ්ඩලයේ කාර්ය සඳහා කඩිනමින් අවශ්‍ය නොවන එහි මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සුරැකුම්පත්වල ආයෝජනය කිරීම;

(ච) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි මුදල් ණයට ගැනීම;

(ජ) මණ්ඩලයේ බලතල සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි කොන්ත්‍රාත් හෝ ගිවිසුම් ඇති කර ගැනීම;

(ට) මණ්ඩලය විසින් සලසනු ලබන සේවා සඳහා ගාස්තු අයකිරීම සහ ලබාගැනීම;

(ඩ) මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වාණිජ කටයුතුවල නිරත වීම; සහ

(ණ) රජයේ අදාළ කාර්ය පටිපාටිවලට අනුකූලව, ලැබෙන ප්‍රදානයන් සහ ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත ප්‍රභවයන්ගෙන් ලැබෙන චංචල හා නිශ්චල දේපල පරිත්‍යාගයන් පිළිගැනීම සහ ලබාගැනීම සහ ඒවා මණ්ඩලයේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සඳහා උපයෝගී කර ගැනීම.

**6.** (1) න්‍යෂ්ටික තාක්ෂණය සහ එහි යොදාගැනීම් ක්ෂේත්‍රයේ පලපුරුද්දක් ඇති සහ ශක්‍යතාව දක්වා ඇති තැනැත්තන් අතරින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් සහ මූල්‍යය, නීතිය, සෞඛ්‍යය සහ කර්මාන්ත යන ක්ෂේත්‍රයන්ගෙන් අවම වශයෙන් එක් අයකු ඇතුළත්ව, අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් හත් දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත විය යුතු ය. මණ්ඩලයේ සංයුතිය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද එක් සාමාජිකයකු මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් වර්ෂ තුනක කාලයක් ධුර දැරිය යුතු අතර ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හැර ඔවුන් නැවත පත්කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(4) මණ්ඩලයේ සාමාජිකයන් සහ මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් මේ පනතේ උපලේඛනයේ විධිවිධාන අදාළ විය යුතු ය.

**7.** (1) මණ්ඩලයේ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීමේ දී ඊට සහායවීම සඳහා අවශ්‍ය හෝ උචිත යයි එය අදහස් කරන යම් කමිටු සහ විශේෂඥයන්, මණ්ඩලය විසින් පත්කරනු ලැබිය හැකි ය. කමිටු සහ විශේෂඥයින් පත්කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කමිටුවක් විසින් එහි කටයුතු සහ රැස්වීම් සඳහා වූ කාර්ය පටිපාටි විධිමත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන වගන්තිය යටතේ පත් කරන ලද කමිටුවක සාමාජිකයන්ට සහ විශේෂඥයකුට මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි දීමනා ගෙවීම ද, පවරන ලද කාර්ය ඉටුකිරීම සම්බන්ධයෙන් දරන ලද යම් වියදම් ප්‍රතිපූරණය කිරීම ද කරනු ලැබිය යුතු ය.

**8.** (අ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටුකිරීමේ දී සහ බලතල ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන මෙහෙයුම් නිර්නායක සහ විධාන අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. මෙහෙයුම් නිර්නායක සහ විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයා සතු බලය.

(ආ) අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද යම් මෙහෙයුම් නිර්නායක හෝ විධානවලට මණ්ඩලය අනුකූල විය යුතු ය.

## II වන කොටස

II වන පරිච්ඡේදය

### ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව පිහිටුවීම

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව පිහිටුවීම.

**9.** (1) අයනීකාර විකිරණ සම්බන්ධිත ක්‍රියා පිළිවෙත් නියාමනය කිරීම සහ පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව යනුවෙන් හඳුන්වනු ලබන (මෙම පනතෙහි "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) නියාමන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සභාව, (1) වන උපවගන්තියෙන් එයට දෙන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි විය යුතු ය.

සභාවේ අරමුණු.

**10.** (අ) අයනීකාර විකිරණවලට නිරාවරණය වීම හා බැඳුණු අවදානම් වලින් පුද්ගලයන් සහ පරිසරය ආරක්ෂාකිරීම සඳහා සහ ප්‍රභවයන්ගේ සහ පහසුකම්වල ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය සඳහා ද යෝග්‍ය පරිදි විධිවිධාන යෙදීම;

(ආ) යම් ප්‍රභවයක, න්‍යෂ්ටික ද්‍රව්‍යයක සහ වෙනත් විකිරණශීල ද්‍රව්‍යයක හානිකර බලපෑමෙන් පුද්ගලයන්ගේ සහ පරිසරයේ ආරක්ෂාව තහවුරු කිරීමට සහ ඒ ද්‍රව්‍යවල සහ පහසුකම්වල සුරක්ෂිතතාවය තහවුරු කිරීමට යෝග්‍ය සියලු පියවර ගැනීම; සහ

(ඇ) ශ්‍රී ලංකාව විසින් අනුකූලතාව දැක්විය යුතු යයි නියමිත න්‍යෂ්ටික බලශක්ති ක්ෂේත්‍රයට අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ බැඳීම්වලට අනුකූලතාව දක්වන බව තහවුරු කිරීම,

සභාවේ අරමුණු විය යුතු ය.

සභාවේ කර්තව්‍ය.

**11.** (අ) මේ පනත යටතේ නිකුත් කිරීමට නියමිත බලපත්‍ර නිකුත් කිරීම සහ එම බලපත්‍ර අලුත් කිරීම, වෙනස් කිරීම, අත්හිටුවීම හෝ අහෝසි කිරීම;

(ආ) මේ පනත යටතේ පැනවෙන නියමයන්ට සහ මේ පනත යටතේ නිකුත් කළ බලපත්‍රවල සඳහන් කොන්දේසිවලට අනුකූලතාව දක්වන බව තහවුරු කිරීම පිණිස සෝදිසි කිරීමේ වැඩසටහනක් සකස් කිරීම;

(ඇ) මේ පනතේ විධිවිධානවලට යථා පරිදි අනුකූලතාව දක්වන බව, මේ පනත යටතේ සාදන ලද රෙගුලාසි හෝ රීති සහ නිකුත් කළ බලපත්‍රවල සඳහන් කොන්දේසි නිසිලෙස බලාත්මක කරන බව තහවුරු කිරීමට යෝග්‍ය පියවර ගැනීම;

(ඈ) ශ්‍රී ලංකාව ඇතුළත තිබෙන්නා වූ සියලු ප්‍රභවයන් පිළිබඳ තොරතුරු අඩංගු ජාතික රෙජිස්ටරයක් පවත්වාගෙන යාම;

(ඉ) සභාවේ නියාමන ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු මහජනතාවට, මාධ්‍යවලට සහ වෙනත් අදාළ පරදූරන්නන්ට ලබාදීම;

(ඊ) අයනීකාර විකිරණයෙන් ආරක්ෂාවීම, ප්‍රභවයන් සහ වෙනත් විකිරණශීලී ද්‍රව්‍යයන් පිළිබඳ ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය සහ විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සහ ක්‍රමෝපායක් සකස් කිරීම ගැන අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(උ) විකිරණ ආරක්ෂාව සහ අයනීකාර විකිරණ යොදාගැනීම සම්බන්ධයෙන් වූ රීති, සංග්‍රහ සහ ප්‍රමිති සකස් කිරීම සහ සමාලෝචනය, ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජ්‍යායතනයේ සහ වෙනත් එවැනි ජාත්‍යන්තර සංවිධානවල මනා පරිචයන් පිළිබිඹු වන සේ සකස් කිරීම;

(ඌ) සභාවට යොමු කරන ලද යම් කරුණක් හෝ සභාවේ උපදෙස් දීම යෝග්‍ය යයි සභාව අදහස් කරන කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් ලබාදීම; සහ

(එ) සභාවේ අරමුණු ඉටුකරගැනීම සඳහා අවශ්‍ය යයි සභාව අදහස් කරන වෙනත් කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම, සභාවේ කර්තව්‍ය විය යුතුය.

සභාවේ බලතල.

**12.** මේ පනතින් ප්‍රකාශිතවම පිරිනමන ලද බලතලවලට අමතරව සභාවේ කර්තව්‍ය ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා සභාවට පහත සඳහන් බලතල තිබිය යුතු යඃ-

(අ) විකිරණශීලී ද්‍රව්‍ය නිසා ඇතිවන හදිසි තත්ත්වයන් වැළැක්වීමට පියවර ගැනීම;

(ආ) නියාමන ක්‍රියා පිළිවෙල සහ සිද්ධි, හදිසි අනතුරු සහ අසාමාන්‍ය සිදුවීම් ඇතුළුව නියාමනය කරන ලද ක්‍රියා පිළිවෙත්වල ප්‍රවේසම, සෞඛ්‍ය සහ පාරිසරික අංශයන් සම්බන්ධයෙන් මහජනතාවට, අනිකුත් පරදුරන්නන්ට තොරතුරු දැක්වීම සහ මහජනයා විමසීම සඳහා යාන්ත්‍රණ සහ පටිපාටි ඇති කිරීම;

(ඇ) අයනීකාර විකිරණයෙන් මතුවන හානි හෝ අලාභ පිළිබඳ අවදානමින් සුරක්ෂිතතාවය හා ප්‍රවේසම ප්‍රවර්ධනය කිරීම පිණිස දේශීය සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් ක්‍රියාකිරීම;

(ඈ) සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට සහ වෙනත් අදාළ පුද්ගලයන්ට හෝ පුද්ගල මණ්ඩලයන්ට පුහුණුව ලබාදීම;

(ඉ) ප්‍රභවයන්ගේ ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය පිළිබඳව ශ්‍රී ලංකාව පාර්ශවයක් වන ජාත්‍යන්තර ගිවිසුම්, සම්මුති සහ අදාළ ප්‍රෝටකෝල සහ එකඟතාවයන් යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් ඉටුකිරීම පිණිස අවශ්‍යය වන පියවර ගැනීම;

(ඊ) ප්‍රභවයන් උපයෝගීකර ගැනීම සහ මනුෂ්‍ය ජීවිතයට හෝ පරිසරයට බලපෑමක් කළ හැකි සිද්ධි සහ අසාමාන්‍ය සිදුවීම් පිළිබඳ තොරතුරු තිබෙන විට එම තොරතුරු සභාව තීරණය කරන පරිදි දේශීය සහ ජාත්‍යන්තර පුද්ගලයන්ට සහ මහජනතාවට ලබාදීම;

(උ) සෞඛ්‍යය, ප්‍රවේසම, පාරිසරික සංරක්ෂණය, සුරක්ෂිතතාවය, හදිසි අවස්ථා, විකිරණශීලී අපද්‍රව්‍ය ඇතුළුව න්‍යෂ්ටික සහ විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය හෝ

ආනයනය සහ අපනයනය යන අංශයන්හි ප්‍රවීනත්වය දරන රජයේ නියෝජිතායතන සහ රාජ්‍ය නොවන සංවිධාන හෝ පුද්ගලයන් සමග කටයුතු සම්බන්ධීකරණය කිරීම;

(ඍ) මේ පනතේ විධි විධාන සහ ඒ යටතේ සාදන ලද යම් නියෝග හෝ රීති සහ යම් බලපත්‍රවල කොන්දේසි පිළිබඳ දක්වන අනුකූලතාව නිශ්චය කිරීම සඳහා වූ ක්‍රියා පිළිවෙත් සහ පහසුකම් පරීක්ෂා කිරීම, සමාලෝචනය කිරීම සහ ඇගැයීම;

(එ) බලපත්‍ර සහිත ක්‍රියා පිළිවෙතක් පවත්වා ගෙන යනු ලබන යම් ස්ථානයක ප්‍රවේසම් රහිත හෝ ප්‍රවේසම් රහිත විය හැකි තත්ත්වයක් සොයාගනු ලැබුවහොත් ගතයුතු යයි නියමිත නිවැරදි කිරීමේ පියවර සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීම;

(ඒ) න්‍යෂ්ටික ද්‍රව්‍ය පිළිබඳ වගකීමේ සහ පාලනය කිරීමේ රාජ්‍ය වැඩ පිළිවෙලක් ඇති කිරීම සහ පවත්වාගෙන යාම ඇතුළුව ආරක්ෂණ ගිවිසුම යටතේ වූ බැඳීම් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය සියලු පියවර ගැනීම;

(ඔ) න්‍යෂ්ටික හෝ විකිරණශීලී ද්‍රව්‍ය, අදාළ උපකරණ සහ ආශ්‍රිත පහසුකම් සම්බන්ධිත අනවසර ක්‍රියා සොයාගැනීම, වැලැක්වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම පිණිස ඒ ද්‍රව්‍ය, උපකරණ හෝ පහසුකම්වල භෞතික ආරක්ෂාව ඇතුළුව ඒවාහි සුරක්ෂිතතාවය සඳහා වූ නියාමන පියවර ක්‍රියාවේ යෙදීම;

(ඕ) විකිරණ මිනුම් සහ විකිරණ මිනුම් උපකරණවල ක්‍රමාංකනය පිළිබඳ සහතික නිකුත් කිරීමට සම්බන්ධිත ආයතන හෝ පුද්ගලයන් වෙත අනුමතය ප්‍රදානය කිරීම පිණිස කාර්ය පටිපාටි සහ යාන්ත්‍රණ ඇති කිරීම;

(ක) න්‍යෂ්ටික විද්‍යා සහ තාක්ෂණය සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ විකිරණශීලී හෝ න්‍යෂ්ටික ද්‍රව්‍ය සම්බන්ධිත හදිසි අනතුරක් සිදු වූ විට ගත යුතු නියමිත පූර්වාරක්ෂා පියවර ගැනීම;

(ග) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහ මෙරට දී ලබාගත හැකි යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය පරීක්ෂා කිරීම, විකිරණශීලීතාව පිරික්සීම සඳහා සාම්පල ලබාගැනීම සහ සභාව අවශ්‍යයයි හෝ යෝග්‍යයයි සලකන අවස්ථාවක ඒ පිරික්සුමේ ප්‍රතිඵල මහජනයාගේ සහ අදාළ සියලු නිලධාරීන්ගේ දැනගැනීම පිණිස පළකිරීම:

මේ ඡේදයේ කාර්ය සඳහා "භාණ්ඩ" සහ "වෙළඳ ද්‍රව්‍ය" යන්නට භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය අපනයනය සඳහා යොදා ගත් බහලු, බහලු රැගත් යම් යාත්‍රා හෝ ගුවන් යානා ඇතුළත් වේ;

(ච) චංචල හෝ නිශ්චල දේපල අත්කර ගැනීම සහ දැරීම සහ ඒ දේපල විකිණීම, බදු දීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම;

(ජ) සභාවේ කර්තව්‍ය හා සම්බන්ධ යම් විෂයයක් මත වාර්තා සහ ලේඛන රැස්කිරීම සහ පළකිරීම;

(ට) සභාව විසින් අනුමත කරන ලද බැංකුවක, ජංගම, ඉතිරිකිරීමේ හෝ තැන්පතු බැංකු ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම; සහ

(ඩ) සභාවේ කර්තව්‍ය ඉටුකිරීමට අවශ්‍ය පර්යේෂණාගාර, පුස්තකාල, වැඩපොළවල් සහ කාර්යාල ඇතුළු ගොඩනැගිලි ඉදිකිරීම, අංග සම්පූර්ණ කිරීම සහ නඩත්තු කිරීම.

සභාව විසින් පිළිපැදිය යුතු පොදු මූලධර්ම.

**13.** සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටුකිරීමේ දී සභාව පහත සඳහන් පොදු මූලධර්ම අනුගමනය කළ යුතු යː-

(අ) අයනීකාර විකිරණයේ හානිකර බලපෑම්වලින් මනුෂ්‍ය ජීවිත, දේපළ සහ පරිසරය ප්‍රවේසම් කිරීම සහ ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව;

(ආ) බලපත්‍රයක් ඉල්ලුම්කර ඇති අදාළ ක්‍රියා පිළිවෙත ක්‍රියාත්මක කිරීමට අවසර දීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාධාරණීකරණයක් ඇති බව;

(ඇ) බලපත්‍ර සහිත ක්‍රියා පිලිවෙත්වලින් ඇති විය හැකි සංයුක්ත උපරිම නිරාවරණයක් නිසා ලැබිය හැකි සඵල මාත්‍රාව හෝ සමක මාත්‍රාව සභාව විසින් තීරණය කරනු ලබන මාත්‍රා සීමා නොඉක්මවන පරිදි පුද්ගලයින්ගේ සාමාන්‍ය නිරාවරණය සීමා කරන බව; සහ

(ඈ) ආරක්ෂාව උපරිමව පවත්වා ගැනීම තුළින් ප්‍රත්‍යෙකය මාත්‍රාවේ ප්‍රමාණය, ප්‍රත්‍යෙක නිරාවරණ සංඛ්‍යාව සහ නිරාවරණයන් ඇති විය හැකි සම්භාවිතාව, ආර්ථික හා සමාජීය සාධක සැලකිල්ලට ගනිමින් සාර්ථකව ඉටුකරගත හැකි පහත් මට්ටමකින් පවත්වා ගත යුතු බව.

**14.** (1) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සභාව සමන්විත විය යුතු යඃ- සභාවේ සංයුතිය.

(අ) න්‍යෂ්ටික විද්‍යා සහ තාක්ෂණය ක්ෂේත්‍රයේ හෝ විකිරණ ආරක්ෂාව පිළිබඳ ප්‍රවීණයන් වන තැනැත්තන් තිදෙනෙක්;

(ආ) සභාවේ අරමුණු හා සම්බන්ධ හෝ ඊට අදාළ නෛතික කරුණු විෂයෙහි පළපුරුද්ද ඇති තැනැත්තෙක්; සහ

(ඇ) පරිසර විෂයය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ හෝ අධ්‍යක්ෂවරයකුගේ තත්ත්වයට පහළ නොවන ධුරයක් දරන සහ එම අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්.

(2) අමාත්‍යවරයා විසින් සභාවේ එක් සාමාජිකයකු සභාවේ සභාපතිවරයා වශයෙන් පත්කරනු ලැබිය යුතු ය.

(3) සභාපතිවරයා සහ සභාවේ සෙසු පත්කළ සාමාජිකයන් වර්ෂ තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත්කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(4) මේ පනතේ උපලේඛනයෙහි ඇති විධිවිධාන සභාවේ සාමාජිකයන් සහ සභාවේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**15.** සභාව විසින් මේ පනත යටතේ එහි කර්තව්‍ය ඉටුකිරීමෙහිලා ඊට සහායවීම පිණිස එහි නිලධරයන් අතරින් යම් නිලධරයන් සංඛ්‍යාවක් පරීක්ෂකයන් වශයෙන් (මෙහි මින්මතු "බලයලත් පරීක්ෂකයන් පත්කිරීම.

පරීක්ෂකයන්" වශයෙන් සඳහන් කෙරෙන) පත් කරනු ලැබිය යුතු අතර ඔවුනට සභාව විසින් යෝග්‍ය බලය පැවරීමක් සිදුකළ යුතු ය.

බලයලත් පරික්ෂකයන්ට සහාය වීමට පොලිස් නිලධරයන් පත්කිරීම.

**16.** (1) (අ) බලයලත් පරීක්ෂකයකුට තම කර්තව්‍ය ඉටුකිරීමේ දී සහාය වීම සඳහා සහකාර පොලිස් අධිකාරී තනතුරට ඉහළ නිලයක් දරන යම් පොලිස් නිලධරයකුගේ සේවය ලබා දෙන ලෙස සභාව විසින් පොලිස්පතිවරයාට ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(ආ) සභාව විසින් ඉල්ලීමක් කරන ලද අවස්ථාවක දී, එවැනි පොලිස් නිලධරයෙකුගේ සේවාව ලබා දීම තහවුරු කිරීම පොලිස්පතිවරයාගේ කාර්යයක් විය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් මත පොලිස්පති වරයා විසින් යම් පොලිස් නිලධරයකුගේ සේවා ලබා දී ඇත්තේ ද ඒ පොලිස් නිලධරයා විසින් යම් නීතියක කුමක් සඳහන්ව තිබුන ද එය නොතකා සභාව විසින් කරන ලද යම් පැමිණිල්ලක් මත මේ පනත යටතේ වූ වරදක් කළ බවට සැකකෙරෙන යම් තැනැත්තකු වරෙන්තුවකින් තොරව අත්අඩංගුවට ගත යුතු ය.

(ආ) එකී වරද කළ බවට චෝදනා කෙරෙන්නේ යම් මහේස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ මහේස්ත්‍රාත් අධිකරණය වෙත පොලිස් නිලධරයා විසින් ඒ තැනැත්තා ඉදිරිපත් කළ යුතු ය.

උපදේශක කමිටු පත්කිරීම.

**17.** (1) මේ පනත යටතේ සභාවේ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා සභාවට සහාය වීම පිණිස සභාව විසින් -

(අ) අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි එය සලකන උපදේශක කමිටු සංඛ්‍යාවක් පත් කිරීම; සහ

(ආ) එහි ස්ථිර කාර්ය මණ්ඩලයෙන් පිටත විශේෂඥයන්ගේ සේවා උපදේශකයන් හෝ විශේෂඥයන් වශයෙන් ලබා ගැනීම,

කළ හැකි ය ඃ

එසේ වුව ද, යම් උපදේශක කමිටු පත් කරනු ලැබීම හෝ ස්ථිර කාර්ය මණ්ඩලයෙන් පිටත යම් විශේෂඥයකුගේ සේවා ලබාගැනීම හේතු කොටගෙන මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග හෝ රීති යටතේ සභාවට පවතින වගකීම් සහ කාර්යවලින් සභාව කිසිසේත් නිදහස් නොවිය යුතු ය.

(2) සම්බන්ධතා පිළිගැටුමක් ඇත්තා වූ හෝ මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග හෝ රීතී යටතේ සභාව විසින් ගත යුතුයයි නියමිත යම් තීරණයක් කෙරෙහි අනිසි බලපෑමක් කළ හැකි තත්ත්වයක සිටින්නා වූ කිසිම තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ උපදේශක කමිටුවක සාමාජිකයකු හෝ විශේෂඥයකු වශයෙන් පත් නොකෙරෙන බව තහවුරු කිරීම සභාවේ කාර්යය විය යුතු ය.

## III වන පරිච්ඡේදය

### බලපත්‍ර නිකුත් කිරීම

**18.** (1) මණ්ඩලය ද ඇතුළු කිසිම තැනැත්තකු විසින් මේ පනතෙහි "ක්‍රියා පිළිවෙතක්" යනුවෙන් සඳහන් කරනු ලබන අයනීකාර විකිරණ සම්බන්ධිත ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමː- ක්‍රියා පිළිවෙතක් පැවැත්වීම සඳහා බලපත්‍රයක් ලබාගත යුතු බව.

(අ) තත්කාර්ය සඳහා සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ මිස; හෝ

(ආ) එය මේ පනතේ විධිවිධාන මගින් සභාවේ නියාමන පාලනයෙන් නිදහස් කරනු ලැබ ඇති ක්‍රියා පිළිවෙතක් නම් මිස,

නොකළ යුතු ය.

(2) තත්කාර්ය සඳහා බලපත්‍රයක් ලබානොගෙන ක්‍රියා පිළිවෙතක් පවත්වන හෝ ක්‍රියා පිළිවෙතක් පැවැත්වීම පිණිස යම් ප්‍රභවයක් උපයෝගී කර ගන්නා තැනැත්තකු වරදක් කරන අතර ඒ තැනැත්තා මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන තුනකට නොවැඩි දඩයකට හෝ වසර හතකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

**19.** (1) පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් යම් ක්‍රියා පිළිවෙතක් හෝ ක්‍රියා පිළිවෙතක් ඇතුළත වූ ප්‍රභවයක් ගැසට් පත්‍රයේ පළකෙරෙන නියමයක් මගින් සභාවේ නියාමන පාලනයෙන් නිදහස් කිරීමේ බලය සභාව සතු විය යුතු යː- නිශ්චිත ක්‍රියා පිළිවෙත් හෝ ක්‍රියා පිළිවෙතක් ඇතුළත වූ ප්‍රභවයක් සභාව විසින් බලපත්‍රයක් ලබාගැනීමෙන් නිදහස් කළ හැකි බව.

(අ) ක්‍රියා පිළිවෙත පැවැත්වීමෙන් හෝ අදාළ ප්‍රභවයෙන් මහජනයා අතුරින් යමෙකුට සිදුවිය හැකි විකිරණ අවදානම සභාවේ නියාමන සැලකිල්ල යොමු නොවන තරමට සුළු වීම;

(ආ) ක්‍රියා පිළිවෙත හෝ අදාළ ක්‍රියා පිළිවෙත ඇතුළත වූ ප්‍රභවයේ සාමූහික විකිරණශීලී බලපෑම පවත්නා තත්ත්වයන් යටතේ සභාවේ නියාමන පාලනය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය නොවන තරමට සුළුවීම;

(ඇ) ඉහත (අ) සහ (ආ) ඡේදවල සඳහන් සාධක නොපැවතීමට තුඩු දෙන තත්ත්වයක් මතු වීමට ඉඩ නැති පරිදි ඇති ක්‍රියා පිළිවෙත සහ ක්‍රියාපිළිවෙත ඇතුළත වූ ප්‍රභවය ආවේණිකවම ප්‍රවේසම් සහිත වීම; සහ

(ඈ) ක්‍රියා පිළිවෙත, 22 (1) (ආ) වගන්තියෙහි දැක්වෙන පදනම මත සාධාරණීකරණය කළ හැකි එකක් වීම.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් -

(අ) ක්‍රියා පිළිවෙත පැවැත්වීම හේතුකොට ගෙන වර්ෂයක් තුළ දී මහජනයාගෙන් යම් තැනැත්තකු පාත්‍ර වෙතැයි අපේක්ෂිත සඵල මාත්‍රා මට්ටම නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය;

(ආ) ක්‍රියා පිළිවෙතක් ඇතුළත ප්‍රභවයක් නිදහස් කිරීමට අදාළ වන අවස්ථාවක යම් වේලාවක ස්ථානයෙහි ඇති න්‍යූක්ලයිඩයක මුළු සක්‍රීයතාවේ අවම මට්ටම සහ ක්‍රියා පිළිවෙතෙහි උපයෝගී කර ගන්නා න්‍යූක්ලයිඩයේ සක්‍රීයතා සාන්ද්‍රනය නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය;

(ඇ) නිදහස් කිරීම ක්‍රියා පිළිවෙතක උපයෝගී කරගනු ලබන උපකරණයකට අදාළ වේ නම් ඒ උපකරණයෙන් සාමාන්‍ය ක්‍රියාකාරී තත්ත්වයන්හි ඇති කෙරෙන පරිසර මාත්‍රා සීඝ්‍රතාව සහ දිශා මාත්‍රා සමක සීඝ්‍රතාව සහ ඒ උපකරණයෙන් නිපදවෙන විකිරණයේ ශක්ති මට්ටම් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් ඒ ආකාරයෙන්ම කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි අතර එමගින් (2) වන උපවගන්තියෙහි සඳහන් උපමානයන් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

ක්‍රියා පිළිවෙත් පැවැත්වීමේ අදහස පිළිබඳ දැනුම් දීමක් කළ යුතු බව.

**20.** (1) ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමට අදහස් කරනු ලබන තැනැත්තකු විසින් ඒ ක්‍රියා පිළිවෙත පැවැත්වීමේ අදහස පිළිබඳ දැනුම්දීමක් සභාව විසින් තත් කාර්ය සඳහා සාදන ලද රීතිවලින් නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුව සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර ඒ දැනුම්දීම සමඟ පහත දැක්වෙන තොරතුරු ඉදිරිපත් කරනු ලැබිය යුතු යඃ-

(අ) ක්‍රියා පිළිවෙත පැවැත්වීමට අපේක්ෂා කරන්නේ කවර අරමුණක් සඳහා ද යන වග;

(ආ) විකිරණශීලී ද්‍රව්‍යය සම්බන්ධ කරගනු ලබන විට ඒ ද්‍රව්‍යය උපයෝගී කර ගන්නේ කවර කාර්යකට ද යන වග සහ ඒ විකිරණශීලී ද්‍රව්‍යයෙන් පාවිච්චි කෙරෙන උපරිම විකිරණශීලීතාවය;

(ඇ) ක්‍රියා පිළිවෙත පැවැත්වීමේ දී ප්‍රවිකිරණ උපකරණයක් පාවිච්චි කරන අවස්ථාවක දී ඒ උපකරණය මගින් නිපදවනු ලැබිය හැකි අපේක්ෂිත අයනීකාර විකිරණයේ උපරිම ශක්තිය; සහ

(ඈ) න්‍යෂ්ටික හෝ විඛණ්ඩනය කළ හැකි ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන විට ඒ ද්‍රව්‍යයෙහි එක් එක් සංඝටකයේ විකිරණශීලතා මට්ටම සහ ප්‍රතිශතය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලද දැනුම්දීමක අඩංගු තොරතුරු මත සභාව විසින් -

(අ) අදාළ ක්‍රියා පිළිවෙත 19 වන වගන්තිය යටතේ කරන ලද නියමයකින් නිදහස් කරන ලද්දක් ද යන වග; හෝ

(ආ) ක්‍රියා පිළිවෙත සභාව විසින් නිදහස් කරන ලද්දක් නොවන අවස්ථාවක ක්‍රියා පිළිවෙතේ ස්වභාවය සැළකිල්ලට ගත් විට ක්‍රියා පිළිවෙත පැවැත්වීම සඳහා බලපත්‍රය ලබා ගැනීමට පෙර -

(i) අදාළ ගොඩනැගිල්ලේ හෝ ඉදිකිරීමේ සැලැස්මෙහි ප්‍රමාණවත් විකිරණ සුරක්ෂිත ක්‍රම ඇතුළත්කර තිබෙන බව තහවුරු කිරීම පිණිස ගොඩනැගිල්ලේ

හෝ ඉදිකිරීමෙහි සැලැස්ම සඳහා සභාවේ අනුමතය අවශ්‍ය ද යන වග; සහ

(ii) යම් විකිරණශීලී ද්‍රව්‍යයක්, ප්‍රවිකිරණ උපකරණ හෝ විකිරණ ප්‍රභවයක් ඇතුළත් යන්ත්‍රෝපකරණ ආනයනය කිරීම හෝ අපනයනය කිරීම අවශ්‍ය වන අවස්ථාවක එසේ ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සඳහා සභාවේ අනුමතය අවශ්‍ය ද යන වග,

තීරණය කළ යුතු ය.

(3) (අ) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ එහි සඳහන් අනුමතය ලබා ගැනීම අවශ්‍ය බව තීරණයක් කළ විට, සභාව විසින් නොපමාව ඒ තීරණය දැනුම් දීමක් ඉදිරිපත් කළ තැනැත්තාට සන්නිවේදනය කළ යුතු ය; සහ

(ආ) එම ඡේදය යටතේ අනුමතයක් ලබා ගැනීම අවශ්‍යයයි සභාව තීරණය කරන අවස්ථාවක දී සභාවේ අනුමතය ලබා ගැනීම සඳහා සන්නිවේදනයේ නිශ්චිතව සඳහන් තොරතුරු සහ අනුමත කිරීමේ ගාස්තුව ඉදිරිපත් කරන ලෙස අදාළ තැනැත්තාගෙන් ඉල්ලීමක් කළ යුතු ය.

බලපත්‍රයක් සඳහා ඉල්ලුම්පත.

**21.** (1) සභාව විසින් -

(අ) ඉදිරිපත් කරන ලද දැනුම් දීමට අදාළ අපේක්ෂිත ක්‍රියා පිළිවෙත පැවැත්වීම සඳහා බලපත්‍ර ලබාගැනීමට පෙර අනුමතයක් අවශ්‍ය නොවන බව 20 (2) වන උපවගන්තිය යටතේ තීරණය කරන අවස්ථාවක; හෝ

(ආ) 20 (3) වන උපවගන්තිය යටතේ ලැබුණු තොරතුරු සලකා බැලීමෙන් පසු මතය ලබා දෙන අවස්ථාවක,

ක්‍රියා පිළිවෙත ආරම්භ කිරීමට පෙර යෝග්‍ය බලපත්‍රයක් සඳහා ඉල්ලුම්පතක් ඉදිරිපත් කරන ලෙස සභාව විසින් අදාළ තැනැත්තාට දැන්විය යුතු ය.

(2) බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම්පත ඒ සඳහා සභාව විසින් සපයනු ලබන නියමිත ආකෘති පත්‍රයෙහි විය යුතු අතර ඒ සමග සභාව තීරණය කළ ඉල්ලුම්පත් ක්‍රියාවලි ගාස්තුව ඉදිරිපත් කළ යුතු ය.

**22.** (1) 21(2) වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පතකින් ඉල්ලා සිටින ක්‍රියා පිළිවෙත පැවැත්වීම සඳහා වූ බලපත්‍රය ඉල්ලුම් කිරීමේ දී ඉල්ලුම්කරු පහත සඳහන් කරුණු සපුරා ඇති විට සහ ඒ සම්බන්ධව සභාව සෑහීමට පත් වූ පසු සභාව විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු යඃ- ඉල්ලුම්පත් සලකා බැලීමේ ක්‍රියාවලියට භාජනය කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම.

(අ) ක්‍රියා පිළිවෙත පැවැත්වීමට අපේක්ෂිත ගොඩනැගිල්ල සම්බන්ධයෙන් සභාව අනුමත කළ ගොඩනැගිලි සැලැස්මක් වී නම් එහි අවශ්‍යතා ඉල්ලුම්කරු විසින් ඉටුකර තිබීම;

(ආ) ඒ ක්‍රියා පිළිවෙතින් ඇතිවිය හැකි විකිරණ හානිය හිලව් කිරීමට තරම් ප්‍රමාණවත් ප්‍රතිලාභ එයට නිරාවරණය වූ පුද්ගලයන්ට හෝ සමාජයට ඉන් ඇති කෙරෙන්නෙහිය යන පදනම මත අදාළ ක්‍රියා පිළිවෙත පැවැත්වීම සාධාරණීකරණය කළ හැකි තත්වයක ඉල්ලුම්කරු සිටින බව;

(ඇ) ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය තහවුරු කළ හැකි පරිදි ක්‍රියා පිළිවෙත පැවැත්වීමට හැකි වන සේ ඉල්ලුම්කරුට ප්‍රමාණවත් සම්පත් තිබෙන බව සහ ප්‍රමාණවත් ගණනකින් යුත් තාක්ෂණික සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් සිටින බව;

(ඈ) නිරාවරණය වීම් මේ පනත යටතේ නියමිත මාත්‍රා සීමාවලට පහළ බව තහවුරු කිරීමට ඉල්ලුම්කරු විසින් යෝග්‍ය පියවර ගෙන තිබෙන බව;

(ඉ) සාධාරණ ලෙස අත්කර ගත හැකි ඉහළම මට්ටමේ ප්‍රවේසම ලබා දෙන සේ ආරක්ෂාව ඉමහත් බව තහවුරු කිරීමට ප්‍රමාණවත් පියවර ඉල්ලුම්කරු ගෙන ඇති බව;

(ඊ) විකිරණ ආරක්ෂාව හා සම්බන්ධ ප්‍රධාන මූලධර්ම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඉල්ලුම්කරුට ඇති බව;

(උ) අදාළ ක්‍රියා පිළිවෙත අවසන් කිරීමට සිදුවුවහොත් ඒ සම්බන්ධයෙන් වන වගකීම් ඉටු කිරීමට ඉල්ලුම්කරුට ප්‍රමාණවත් මූල්‍ය සම්පත් තිබෙන බව සහ තාක්ෂණික සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක් සිටින බව;

(ඌ) ක්‍රියා පිළිවෙත පැවැත්වීම නිසා ඇතිවිය හැකි අවදානමේ ස්වභාවය, විශාලත්වය හා සම්භාවිතාව ගැන ඇගයීමක් ඉල්ලුම්කරු විසින් කර තිබෙන බව;

(එ) සේවකයන්ගේ, මහජනතාවගේ, පරිසරයේ ආරක්ෂාව සහ ප්‍රවේසම සඳහා සහ විකිරණශීලී ප්‍රභවයන්ගේ සුරක්ෂිතතාවය සඳහා ගතයුතු යැයි නියමිත සියළු අවශ්‍ය පියවර ඉල්ලුම්කරු විසින් ගෙන තිබෙන බව;

(ඒ) මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග හෝ රීති පිළිපැදීම පහසු කිරීමට අවශ්‍ය වන්නා වූ සැපයුම්කරුගේ හෝ නිෂ්පාදකයන්ගේ ලැබෙන අදාළ තාක්ෂණික තොරතුරු ඉල්ලුම්කරු විසින් සභාවට සපයා ඇති බව; සහ

(ඔ) හදිසි අවස්ථා සූදානම සහ ප්‍රතික්‍රියා සැලැස්මක් පිළියෙළකර ලබා දී ඇති බව.

(2) (1) වන උපවගන්තියේ සඳහන් උපමානය අනුව සභාව-

(අ) ක්‍රියා පිළිවෙත පැවැත්වීමට බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබීමට ඉල්ලුම්කරු යෝග්‍ය යැයි සෑහීමට පත්වන විට ඒ සඳහා නියමිත ආකෘතියෙහි වූ බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබීමට ඉල්ලුම්කරු යෝග්‍ය නැතැයි නිගමනය කරන විට ඉල්ලන ලද බලපත්‍රය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කර ඒ ප්‍රතික්ෂේප කිරීම සහ ඊට අදාළ හේතු ඉල්ලුම්කරුට දැන්විය යුතු ය.

බලපත්‍රයක කොන්දේසි.

**23.** (1) 22 වන වගන්තිය යටතේ නිකුත් කර ඇති යම් බලපත්‍රයක්:-

(අ) බලපත්‍රයෙහි සඳහන් කොන්දේසිවලට සහ නියමයන්ට යටත්ව විය යුතු ය;

(ආ) සභාව විසින් තීරණය කරනු ලබන බලපත්‍ර ගාස්තුව ගෙවීමට යටත් විය යුතු ය;

(ඇ) තත්කාර්ය සඳහා සාදන ලද රීතිවලට අනුකූලව සභාව විසින් තීරණය කරනු ලබන කාලයක් සඳහා වලංගු විය යුතු අතර ඒ බව බලපත්‍රයේ දක්වා තිබිය යුතු ය; සහ

(ඈ) පැවරිය නොහැකි ය.

(2) නිකුත් කරන ලද බලපත්‍ර, ඒ බලපත්‍ර නිකුත් කිරීමට පදනම් වූ කරුණු, එක් එක් බලපත්‍රය මත පැනැවුණු කොන්දේසි සහ අවශ්‍යතා පිළිබඳ විස්තර සහ බලපත්‍රයක් ප්‍රතික්ෂේප කළ අවස්ථා සම්බන්ධයෙන් වූ විට ප්‍රතික්ෂේප කිරීමට හේතු වාර්තා කෙරෙන රෙජිස්ටරයක් සභාව විසින් පවත්වා ගෙන යා යුතු ය.

බලපත්‍රලාභියාගේ මූලික කාර්යය.

**24.** අයනීකාර විකිරණයේ හානිකර බලපෑමෙන් මනුෂ්‍ය ජීවිත හා පරිසරය ආරක්ෂා කිරීම පිණිස අවශ්‍ය තාක්ෂණික සහ සංවිධානමය පියවර ආරම්භ කර ක්‍රියාත්මක කිරීම සහ බලපත්‍ර යටතේ පාවිච්චි කිරීමට බලය දෙන ලද විකිරණශීලී ප්‍රභවයන්ගේ ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය තහවුරු කිරීම බලපත්‍රලාභියාගේ මූලික කාර්යය විය යුතු ය.

අධිනිරාවරණය වාර්තා කිරීම සහ සොරකම යනාදිය.

**25.** සෑම බලපත්‍රලාභියකු විසින් -

(අ) විකිරණයන්ට අධිනිරාවරණය වීමක් සිදු වූ විට, එවැනි සිදුවීමක් සිදු වී පැය විසි හතරකට නොඅඩු කාලයක් තුළ; සහ

(ආ) යම් ප්‍රභවයක් හෝ ද්‍රව්‍යයක් නැතිවීම, සොරකම් කිරීම, විකිරණ හදිසි අවස්ථාවක් හෝ අනවසර අරමුණක් සඳහා යොමුවීම පිළිබඳ යම් සිදුවීමක් ගැන දැනගැනීමෙන් පැය විසිහතරක් තුළ,

ඒ පිළිබඳ සභාවට වාර්තා කළ යුතු අතර ඉන් පසුව ඒ සම්බන්ධව අනුකූලව ක්‍රියාකිරීම සඳහා සභාව විසින් නියම කරනු ලැබිය හැකි යම් හදිසි ක්‍රියාමාර්ගයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා පැනවුනු නියමයන්ට අනුකූලවීම.

**26.** විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සම්බන්ධිත ක්‍රියා පිළිවෙතක් පැවැත්වීම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ සිටින සෑම බලපත්‍රලාභියකු විසින් ම සභාව විසින් තත්කාර්ය සඳහා සාදන ලද රීති මගින් පැහැදිලිව දක්වා ඇති ඒ විකිරණශීලී ද්‍රව්‍ය සහ විකිරණශීලී ප්‍රභවයන් ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කරන

බහලු හෝ ඇසුරුම් සඳහා වූ පිරිවිතරවලට අදාළ නියමයන් ඇතුළු නියමයන්ට අනුකූලතාව දැක්විය යුතු ය.

බලපත්‍රයක් වෙනස් කිරීම.

**27.** (1) පහත සඳහන් හේතුන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් සිදුවූ විට අදාළ බලපත්‍රය වෙනස් කිරීම සඳහා ඉල්ලීමක් ලියවිල්ලක් මගින් සභාවට ඉදිරිපත් නොකර ඒ බලපත්‍රයෙහි සඳහන් ක්‍රියා පිළිවෙත පැවැත්වීම බලපත්‍රලාභියා විසින් දිගටම කරගෙන යාම තහනම් වේ :-

(අ) බලපත්‍රයකින් බලය දෙන ලද ප්‍රභවයට වෙනස් වූ ප්‍රභවයක් පාවිච්චි කිරීමට අදහස් කෙරෙන අවස්ථාවක;

(ආ) විකිරණශීලී ද්‍රව්‍යයක, බලපත්‍රයකින් බලය දෙන ලද ප්‍රමාණයට වඩා ඉහළ විකිරණශීලි සක්‍රියතාවයක් පාවිච්චි කිරීමට අදහස් කෙරෙන අවස්ථාවක;

(ඇ) අදාළ ක්‍රියා පිළිවෙත පැවැත්වීම සඳහා පාවිච්චි කරන ලද භෞතික යටිතල පහසුකම්වල වෙනසක් කිරීමට අදහස් කෙරෙන අවස්ථාවක; හෝ

(ඈ) බලපත්‍රයට අදාළ ක්‍රියා පිළිවෙත පැවැත්වීමේ දී නව සේවා නියුක්තයන් සේවයෙහි යෙදවීමට අදහස් කෙරෙන අවස්ථාවක.

(2) බලපත්‍රයේ වෙනස් කිරීම සඳහා ඉල්ලීමක් කිරීමට තුඩු දුන් තත්ත්වයන් සලකා බැලීමෙන් පසු සභාව විසින් අවසර දිය හැකි වෙනස් කිරීම් කවරේ දැයි තීරණය කොට නිකුත් කරන ලද බලපත්‍රය ඒ අනුව වෙනස් කළ යුතු ය.

බලපත්‍රය අලුත් කිරීම.

**28.** (1) ස්වකීය බලපත්‍රය අලුත් කර ගැනීමට අදහස් කරන බලපත්‍රලාභියකු විසින් ඒ බලපත්‍රය අවසන් වීමේ දිනට පෙරාතුව තුන් මසකට නොඅඩු කාලයක් ඇතුළත ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

(2) බලපත්‍රලාභියකු (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට අසමත් වන අවස්ථාවක, එම බලපත්‍රලාභියා විසින් බලපත්‍රය අලුත් කිරීමට අදහස් නොකරන්නේ නම් හැර සභාව විසින් නොපමාව එම බලපත්‍රලාභියා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත්

කිරීමට යොමුකළ යුතු අතර බලපත්‍රය අලුත් කිරීම අවසන් වන තෙක් තාවකාලික බලපත්‍රයක් නිකුත් කළ හැකි ය.

(3) බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ඒ සඳහා සභාව විසින් සපයා ඇති ආකෘති පත්‍රයෙන් අලුත් කිරීමේ ගාස්තුව ද සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ ඉල්ලුම් පත්‍රය සලකා බැලීමේ ක්‍රියාවලියට භාජනය කිරීම සම්බන්ධයෙන් මේ පනතේ 22 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(4) බලපත්‍රය අලුත් කෙරෙන අවස්ථාවක බලපත්‍රය මුලින් නිකුත් කිරීමේ දී එය යටතේ වූ කොන්දේසි සහ අවශ්‍යතාවයන්ට අමතරව සභාව යෝග්‍ය යැයි සලකන්නේ නම් වැඩිදුර කොන්දේසි සහ අවශ්‍යතා පනවනු ලැබිය හැකි ය.

බලපත්‍රයක් අලුත් නොකෙරෙන විට ඒ බව සභාවට දැන්වීම.

**29.** (1) බලපත්‍රලාභියකු තම බලපත්‍රය අලුත් කිරීමට අදහස් නොකරන අවස්ථාවක, ඒ බව බලපත්‍රය අවසන් වීමේ දිනට පෙරාතුව වූ තුන් මසකට නොඅඩු කාලයක් ඇතුලත සභාවට දැන්වීම ඒ බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේය. එසේ දැන්වීම පැහැර හැරීම මේ පනත යටතේ වරදක් වන අතර ඒ පුද්ගලයා එම වරදට වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ක්‍රියා පිළිවෙතක් පැවැත්වීම සඳහා වූ බලපත්‍රයක් අලුත් නොකරන අවස්ථාවක ඒ ක්‍රියා පිළිවෙතට සහ ඒ සම්බන්ධයෙන් 33 වන වගන්තියේ (3), (4) සහ (5) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

බලපත්‍රයක් අලුත් කිරීමට අසමත් වීමේ බලපෑම.

**30.** (1) බලපත්‍රලාභියකු තම බලපත්‍රය අවසන් වීමේ දිනට තුන් මසකට පෙර එය අලුත් කිරීම සඳහා ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීම පැහැර හරින අවස්ථාවක බලපත්‍රය අලුත් කිරීමේ දී ගෙවිය යුතුයැයි නියමිත අලුත් කිරීමේ ගාස්තුවට අමතරව බලපත්‍රය අවසන් වීමේ දිනය දක්වා එක් එක් දිනය වෙනුවෙන් සභාව විසින් තත්කාර්ය සඳහා සාදනු ලබන රීතිවලින් තීරණය කරනු ලබන ප්‍රමාණයක අධිභාරයක් ගෙවීමට බලපත්‍රලාභියා යටත් විය යුතු ය.

(2) බලපත්‍රලාභියකු බලපත්‍රය අවසන් වීමේ දිනයට පෙර බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමට අසමත්

වන අවස්ථාවක, එම බලපත්‍රය අවසන් වූ වහාම පහත සඳහන් පියවර ගැනීමේ බලය සභාව සතු විය යුතු ය :-

(අ) ක්‍රියා පිළිවෙත පවත්වනු ලබන පරිශ්‍රයට මුද්‍රා තැබීමට සැලැස්වීම සහ ඒ මුද්‍රා තැබීමෙන් දින 7ක් ඇතුලත පරිශ්‍රයට මුද්‍රා තැබීම තහවුරු කිරීමේ ආඥාවක් ලබා ගැනීම පිණිස මහේස්ත්‍රාත් අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කිරීම; සහ

(ආ) විකිරණශීලී ප්‍රභවයේ ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය තහවුරු කළ හැකි ආකාරය සම්බන්ධයෙන් සහ මිනිස් ජීවිතවල සහ පරිසරයේ ආරක්ෂාව සඳහා යෝග්‍යයැයි සභාව සලකන බලපත්‍රලාභියා විසින් තරයේ පිළිපැදිය යුතු විධාන නිකුත් කිරීම.

(3) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ විධාන නිකුත් කරනු ලැබූ බලපත්‍රලාභියකුට සහ ඒ බලපත්‍රලාභියා සම්බන්ධයෙන් මේ පනතේ 33 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

බලපත්‍රයක් අවලංගු කිරීමට හේතු.

**31.** සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් පහත සඳහන් අවස්ථාවක දී කවර හෝ වේලාවක තත් කාර්ය සඳහා බලපත්‍රලාභියාට යවනු ලබන දැනුම් දීමකින් අවලංගු කරනු ලැබිය හැකි ය :-

(අ) පිළිගත නොහැකි තර්ජනයක් හෝ අවදානමක් මහජන සෞඛ්‍යයට ඇති කරන්නා වූ හෝ පරිසරයට අන්තරායයක් වන්නා වූ බලපත්‍රයේ යම් කොන්දේසියක් කඩ කිරීමක් හෝ මේ පනතේ විධිවිධානයන් හෝ මේ යටතේ සාදන ලද නියෝගයක් හෝ රීතියක් බලපත්‍රලාභියා විසින් උල්ලංඝනය කර තිබීම;

(ආ) බලපත්‍රලාභියා, සභාව විසින් 39 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් විධානයන්ට අනුකූලතාව දැක්වීමට වලංගු හේතුවක් නොමැතිව අසමත් වීම;

(ඇ) බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් ක්‍රියා පිළිවෙතක් පැවැත්වීම සඳහා ද එය පැවැත්වීම හෝ කරගෙන යාම බලපත්‍රලාභියා විසින් නතර කර තිබීම;

(ඇ) නිකුත් කරන ලද බලපත්‍රයට අදාළ ක්‍රියා පිළිවෙත දිගටම පැවැත්වීම මගින් පිළිගත නොහැකි තර්ජනයක් හෝ අවදානමක් මහජන සෞඛ්‍යයට ඇති කරතැයි හෝ පරිසරයට අන්තරායයක් වෙතැයි බලපවත්නා යම් තත්ත්වයන් යටතේ සභාව විසින් තීරණය කිරීම; හෝ

(ඉ) නිශ්චිත ස්වභාවික හෝ වෙනත් හේතු නිසා ප්‍රතිග්‍රාහක පරිසරය වෙනස් වී තිබීම අනුව ක්‍රියා පිළිවෙත දිගටම පැවැත්වීම මහජන සෞඛ්‍යයට අවදානමක් හෝ පරිසරයට අන්තරායයක් බවට පත්වීම.

බලපත්‍රයක් අවලංගු කළ පසු ක්‍රියා පිළිවෙතක් පැවැත්වීම වරදක් බව.

**32.** 31 වන වගන්තිය යටතේ තම බලපත්‍රය අවලංගු කරනු ලැබූ පසු ක්‍රියා පිළිවෙත දිගටම පවත්වනු ලබන යම් තැනැත්තකු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකට වරදකරු කරනු ලැබීමේ දී ඒ තැනැත්තා රුපියල් මිලියන 3 කට නොවැඩි දඩයකට හෝ අවුරුදු 7 කට නොවැඩි කාලසීමාවක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

අවලංගු කරනු ලැබූ විටක දී යම් ප්‍රභවයකට මුද්‍රා තැබීම.

**33.** (1) සභාව විසින් බලපත්‍රයක් අවලංගු කරනු ලබන අවස්ථාවක ක්‍රියා පිළිවෙත පැවැත්වීම දිගටම කරගෙන යාම වැළැක්වීම පිණිස සභාව විසින් නියමිත ස්ථානවල හෝ යම් ප්‍රභවයකට මුද්‍රා තැබීමට සැලැස්විය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ක්‍රියාත්මක කරන ලද මුද්‍රා තැබීමෙන් දින 7ක් ඇතුළත සභාව විසින් මහේස්ත්‍රාත් අධිකරණයකට ඉල්ලීමක් ඉදිරිපත් කොට ක්‍රියාත්මක කරන ලද මුද්‍රා තැබීම ස්ථිර කිරීමේ ආඥාවක් ලබා ගත යුතු ය.

(3) බලපත්‍රයක් අවලංගු කරන අවස්ථාවේ දී හෝ ඉන් කවර හෝ වේලාවක විකිරණශීලි ප්‍රභවයන්ගේ ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය තහවුරු කළ හැකි ආකාරය ගැන සහ මනුෂ්‍ය ජීවිත සහ පරිසරයේ ආරක්ෂාව සඳහා වූ විධාන සභාව විසින් බලපත්‍රලාභියාට නිකුත් කරනු ලැබිය හැකි අතර බලපත්‍රලාභියා එසේ නිකුත් කරන ලද විධානවලට අනුකූලතාව දැක්විය යුතු ය.

(4) නිකුත් කරන ලද විධානවලට සතුටුදායක ලෙස අනුකූලතාව දක්වා ඇති බවට සහ අදාළ ක්‍රියා පිළිවෙත පැවැත්වීමේ දී පාවිච්චි කරන ලද විකිරණශීලී ද්‍රව්‍ය හෝ ප්‍රභවයන් මනුෂ්‍ය ජීවිතයට හා පරිසරයට තර්ජනයක් වීම අවසන් වී ඇති බවට සභාව සෑහීමකට පත්වූ විට සභාව විසින් (3) වන උපවගන්තිය යටතේ විධාන නිකුත් කරනු ලැබූ බලපත්‍රලාභියකු මේ පනත යටතේ පැවැත්වෙන සියළු නියාමන බැඳීම් වලින් නිදහස් කරනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධානවලට අනුකූල නොවීම මේ පනත යටතේ වූ වරදක් වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

බලපත්‍රයක් අත්හිටුවීම.

**34.** (1) (අ) බලපත්‍රලාභියා බලපත්‍රයේ යම් කොන්දේසියක් කඩකරමින් හෝ මේ පනතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් කඩකරමින් ක්‍රියා කර ඇත්තා වූ ද, ඒ කඩ කිරීම මහජන සෞඛ්‍යයට පිළිගත හැකි තර්ජනයක්, අවදානමක් හෝ පරිසරයට අන්තරායක් නොවන්නා වූ අවස්ථාවක;

(ආ) මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට ඇති කළ හෝ ඇති කළ හැකි අන්තරාය හෝ අවදානම නිවැරදි කිරීමේ පියවර ගැනීමෙන් අඩු කළ හැකි හෝ ඊට පිළියම් කළ හැකි අවස්ථාවක; හෝ

(ඇ) බලපත්‍රලාභියා 39 වන වගන්තිය යටතේ සභාව විසින් නිකුත් කළ විධානයන්ට අනුකූලවීමට හේතුවක් රහිතව අසමත්වන අවස්ථාවක,

බලපත්‍රයක් අත්හිටුවනු ලැබිය හැකි ය.

(2) බලපත්‍රයක් අත්හිටුවීමට තීරණයක් ගනු ලැබූ විට බලපත්‍රලාභියාට යවනු ලබන දැනුම් දීමකින් සභාව විසින් බලපත්‍රය

අත්හිටුවනු ලබන්නේ කවර කාලසීමාවකට ද යන වග සහ අත්හිටුවීම ඉවත් කිරීම පිණිස ගත යුතු නිවැරදි කිරීමේ පියවර කවරේද යන්න නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) (අ) ඒ දැනුම් දීමෙහි නිශ්චිතව සඳහන් නිවැරදි කිරීමේ පියවර හෝ වැඩකටයුතු බලපත්‍රලාභියා විසින් අත්හිටවූ කාලසීමාව ඉක්මවීමට පෙර ක්‍රියාත්මක කළ යුතු ය.

(ආ) අත්හිටුවීමේ කාලසීමාව ඉක්මවීමට පෙර එසේ නිශ්චිතව සඳහන් පියවර හෝ වැඩකටයුතු සම්පූර්ණ කිරීමට බලපත්‍රලාභියාට නොහැකි අවස්ථාවක ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා වැඩිපුර කාලයක් බලපත්‍රලාභියා විසින් ලියවිල්ලකින් ඉල්ලා සිටිය හැකි අතර පවතින තත්ත්වයන් අනුව යෝග්‍ය යැයි සලකන්නේ නම් සභාව විසින් වැඩිපුර කාලයක් ලබා දිය හැකි ය.

(4) නියමිත පියවර සහ වැඩකටයුතු බලපත්‍රලාභියා විසින් සතුටුදායක අයුරින් ක්‍රියාත්මක කර තිබෙන බවට සභාව සෑහීමකට පත්වූ විට සභාව විසින් පනවා තිබුණු අත්හිටුවීම ඉවත් කරනු ලැබිය යුතු ය.

(5) සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැනුම් දීමක් ලැබුණු පසුව සහ (4) වන උපවගන්තිය යටතේ අත්හිටුවීම ඉවත් කිරීමට පෙර ක්‍රියා පිළිවෙත පැවැත්වීම දිගටම කරගෙන යන තැනැත්තකු වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු හතකට නොවැඩි කාලසීමාවක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

බලපත්‍රයක් අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට විරුද්ධව අභියාචන කිරීම.

**35.** (1) බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ නිකුත් කළ බලපත්‍රයක් අත්හිටුවීමෙන් හෝ අවලංගු කිරීමෙන් හෝ අළුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් අතෘප්තියට පත් තැනැත්තෙකු විසින් සභාවේ තීරණය ඒ තැනැත්තාට නිවේදනය කළ දිනයේ සිට මාසයක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ (මෙහි මින්මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ලේකම්වරයාට අභියාචනය කළ හැකි ය.

(2) බලපත්‍රයක් අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට විරුද්ධව කරන ලද අභියාචනය කිසිසේත් ඒ අත්හිටුවීම හෝ අවලංගු කිරීම, අස් කිරීමක් ලෙස බල නොපාන අතර ඒ අභියාචනය සම්බන්ධයෙන් 37 වන වගන්තිය යටතේ ලේකම්වරයා විසින් තීරණයක් කරන තුරු අත්හිටුවන ලද හෝ අවලංගු කරන ලද ක්‍රියා පිළිවෙත අදාළ තැනැත්තා විසින් නොපැවැත්විය යුතු ය.

අභියාචනයක් ඇසීම සඳහා අභියාචන කමිටුවක් පත්කිරීම.

**36.** (1) අභියාචනයක් ලැබී මාසයක් ඇතුළත ඒ අභියාචනය අසා විභාග කිරීමට පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත අභියාචන කමිටුවක් ලේකම්වරයා විසින් පත් කරනු ලැබිය යුතු යː-

(අ) අභියාචන කමිටුවේ සභාපතිවරයා විය යුතු න්‍යෂ්ටික තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම දරන තැනැත්තෙක්;

(ආ) විකිරණ ආරක්ෂාව පිළිබඳ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති තැනැත්තෙක්;

(ඇ) නීතිය පිළිබඳ සුදුසුකම් ඇති තැනැත්තෙක්.

(2) යම් තැනැත්තෙකු -

(අ) සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නේ නම්; හෝ

(ආ) අභියාචන කමිටුව පරීක්ෂා කිරීමට අදහස් කරන අභියාචනයේ විෂයය කාරණය පිළිබඳ සෘජු හෝ වක්‍ර මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇත්තෙකු,

වෙතොත් ඒ තැනැත්තා අභියාචන කමිටුවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට නුසුදුස්සකු විය යුතු ය.

(3) අභියාචන කමිටුවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබූ පසු අභියාචනයේ විෂයය කාරණය පිළිබඳ සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවයක් තමාට ඇති බව සාමාජිකයකුට පෙනී යන අවස්ථාවක ඒ බව ලේකම්වරයාට වහාම දැන්වීම ඒ සාමාජිකයාගේ කාර්යය විය යුතු අතර ලේකම්වරයා විසින් නොපමාව සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තෙකු පත් කරනු ලැබිය යුතු ය.

(4) (අ) අභියාචන කමිටුව අභියාචනයේ පාර්ශ්වකරුවන්ට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දිය යුතු අතර අභියාචනය විභාග කිරීම ආරම්භ කළ දිනයේ සිට මාස දෙකක් ඇතුළත විභාගය අවසන් කර අභියාචනය සම්බන්ධයෙන් තම නිගමනය සහ නිර්දේශ ඇතුළත් වාර්තාවක් අභියාචන කමිටුව විසින් ලේකම්වරයාට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) නියමිත කාලය ඇතුළත කමිටුවට තම විභාගය අවසන් කිරීමට නොහැකි වුවහොත් කාලය දීර්ඝ කරන ලෙස කමිටුව විසින් ලේකම්වරයාගෙන් ලිඛිත ඉල්ලීමක් කළ හැකි අතර මාසයකට වැඩි නොවන කාලය දීර්ඝ කිරීමක් ලේකම්වරයා විසින් දෙනු ලැබිය හැකි ය.

(5) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් දීමනාවක් අභියාචන කමිටුවේ සාමාජිකයන්ට ගෙවිය යුතු ය.

අභියාචනය පිළිබඳ ලේකම්වරයාගේ තීරණය.

**37.** (1) අභියාචන කමිටුවේ වාර්තාව ලැබීමෙන් සති දෙකක් ඇතුළත සහ වාර්තාවේ කර තිබෙන නිර්දේශ සලකා බැලීමෙන් පසුව ලේකම්වරයා විසින් අදාල අභියාචනයට ඉඩ දෙමින් හෝ නිශ්ප්‍රභා කරමින් තීරණයක් ගතයුතු අතර ඒ තීරණය ක්‍රියාත්මක කරන ලෙස සභාවට විධාන කළ යුතු ය.

(2) ලේකම්වරයා අභියාචනය මත කරන ලද තීරණය අභියාචනයේ සියළු පාර්ශවකරුවන්ට වහා නිවේදනය කළ යුතු ය.

බලපත්‍රයක් අවලංගු වීම.

**38.** (1) මේ පරිච්ඡේදය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ තැනැත්තකු :—

(අ) මියගියහොත් හෝ අදාළ තැනැත්තා සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් වූ විට ඒ සමාගම හෝ හවුල් ව්‍යාපාරය බංකොලොත් වුවහොත්; හෝ

(ආ) බුන්වත් වූ බවට විනිශ්චය කරනු ලැබුවහොත්; හෝ

(ඇ) බලපත්‍රය නිකුත් කිරීමට අදාළ වූ ක්‍රියා පිළිවෙත පැවැත්වීම බලපත්‍රයේ කාලය අවසන් වීමට පෙර නතර කිරීමට අදහස් කරතොත්,

නිකුත් කරන ලද බලපත්‍රය අවසාන වී ඇතැයි සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් සිදුවීමක් මත බලපත්‍රයක් අවසාන වී ඇතැයි සලකන අවස්ථාවක දී ඒ සිදුවීම ගැන වහාම සභාවට දැන්වීම සහ ඉන්පසු බලපත්‍රය යටතේ පවත්වන ලද ක්‍රියා පිළිවෙතට සම්බන්ධ විකිරණශීලී ද්‍රව්‍ය හෝ ප්‍රභවයන් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සභාව විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් විධානවලට අනුකූලතාව දැක්වීම අවස්ථාවෝචිත පරිදි බලපත්‍රලාභියාගේ ලඟම ඥාතියාගේ හෝ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන්ගේ හෝ සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ කාර්යය විය යුතු ය.

(3) අදාළ ක්‍රියා පිළිවෙත පැවැත්වීමට පාවිච්චි කරන ලද විකිරණශීලී ද්‍රව්‍ය හෝ ප්‍රභවයන් මිනිස් ජීවිතයට හෝ පරිසරයට තර්ජනයක් නොවන බවට සභාව සෑහීමකට පත්වූ විට සභාව විසින් මේ වගන්තියේ සඳහන් බලපත්‍රලාභියකු මේ පනත යටතේ සියළු නියාමන බැඳීම්වලින් නිදහස් කළ යුතු ය.

සභාව විසින් විධාන නිකුත් කිරීම.

**39.** මිනිස් ජීවිත හා පරිසරයට කෙරෙන යම් හානියක් හෝ අයහපතක් වැලැක්වීමට හෝ අඩු කිරීමට, ප්‍රභවයන්ගේ ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය පිළිබඳ පාලනය ගිලිහී යාම වැලැක්වීමට ගත යුතු පියවර සම්බන්ධයෙන් සභාව විසින් යම් බලපත්‍රලාභියකුට විධාන නිකුත් කිරීම කරනු ලැබිය හැකි ය. බලපත්‍රලාභියා විසින් එසේ නිකුත් කරන ලද විධානවලට අනුකූලතාව දැක්විය යුතු ය.

බලයලත් පරීක්ෂකවරුන්ගේ බලතල හා කාර්යයන්.

**40.** (1) පොදුවේ හෝ විශේෂයෙන් තත්කාර්ය සඳහා බලය දෙන ලද බලයලත් පරීක්ෂකයකු විසින්:–

(අ) ක්‍රියා පිළිවෙත පැවැත්වීමේ දී උපයෝගි කරගනු ලබන ප්‍රභවයන්ගේ හෝ විකිරණශීලී ද්‍රව්‍යවල වර්ග හා ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු හෝ ලේඛන ලබාදෙන ලෙස;

(ආ) විකිරණශීලී හෝ න්‍යෂ්ටික ද්‍රව්‍ය ගබඩා කර තිබෙන ආකාරය සහ ස්ථාන පිළිබඳ විස්තර සපයන ලෙස;හෝ

(ඇ) මේ පනත යටතේ තම කාර්ය නිසිලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි ඔහු හෝ ඇය සලකන වෙනත් යම් තොරතුරු සපයන ලෙස,

බලපත්‍රලාභියකුට හෝ බලපත්‍රලාභියකුගේ සේවා නියුක්තයකුට නියම කළ හැකි ය.

(2) බලයලත් පරීක්ෂකයකුට යම් පරිශ්‍රයක, ගොඩනැගිල්ලක, යාත්‍රාවක, වාහනයක හෝ ගුවන් යානයක :–

(අ) මේ පනතින් නියමිත පරිදි බලපත්‍රයක් ලබා නොගෙන යම් ක්‍රියා පිළිවෙතක් පැවැත්වෙන බව හෝ විකිරණශීලී හෝ න්‍යෂ්ටික ද්‍රව්‍ය ගබඩා කර හෝ ප්‍රවාහනය කෙරෙමින් හෝ ගෙනයමින් තිබෙන බව විශ්වාස කිරීමට ඇයට හෝ ඔහුට සාධාරණ හේතු ඇතිවීම; හෝ

(ආ) පරීක්ෂණයක්, විමර්ශනයක් හෝ විභාගයක් පැවැත්වීමට හෝ යම් සාම්පල ලබාගැනීම සඳහා,

දවසේ කවර හෝ සාධාරණ වේලාවකදී දන්වා හෝ නොදන්වා ඒ පරිශ්‍රයට, ගොඩනැගිල්ලට, යාත්‍රාවට, වාහනයට හෝ ගුවන් යානයට ඇතුළු විය හැකි අතර පරිශ්‍රයෙහි, ගොඩනැගිල්ලේ, යාත්‍රාවේ, වාහනයේ හෝ ගුවන් යානයේ සිටින තැනැත්තන් බලයලත් පරීක්ෂකයාට ඔහුගේ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය සියළු සහාය ලබා දිය යුතු ය.

(3) යම් බලපත්‍රලාභියකු සහ ඒ බලපත්‍රලාභියාගේ සේවා නියුක්තයකු හෝ අනුයෝජිතයකු විසින් ම බලයලත් පරීක්ෂකයකුට මේ පනත යටතේ වන ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ස්ථානයකට ඇතුළුවීමට හා පරීක්ෂා කිරීමට, විභාග කිරීමට සහ සාම්පල ගැනීමට හෝ අන්‍යාකාරයෙන් පනත යටතේ ඔහුගේ කර්තව්‍ය ඉටුකිරීමට අවශ්‍ය සියලු සහාය ලබා දිය යුතු ය.

(4) යම් තැනැත්තෙකු බලයලත් පරීක්ෂකයකුට ඕනෑකමින් බාධා කරන්නාවූ හෝ ඒ තැනැත්තාට නීත්‍යානුකූලව පවරා ඇති කාර්යයක් ඉටුකිරීමෙහි ලා බලයලත් පරීක්ෂක විසින් කරන ලද ඉල්ලීමක් අනුව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරන්නා වූ අවස්ථාවක ඒ තැනැත්තා වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදට වරදකරු කරනු ලැබූ විට රුපියල් තුන් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ බලයලත් පරීක්ෂකයකු විසින් කරන ලද සියළු පරීක්ෂණ පිළිබඳ ලේඛනයක් සභාව විසින් පවත්වා ගත යුතු ය.

ප්‍රභවයන් ඉවත් කිරීමට නියම කිරීමේ බලය.

**41.** (1) නිකුත් කරන ලද බලපත්‍රයකට අදාළ ක්‍රියා පිළිවෙතක් මගින් තැනැත්තන්ට හානි සිදුවීමේ හෝ දේපලවලට හෝ පරිසරයට සැළකිය යුතු හානි සිදුවීමේ අවධානමක් ඇති බව විශ්වාස කිරීමට සාධාරණ හේතු බලයලත් පරීක්ෂකයකුට ඇති අවස්ථාවක දී ඒ ක්‍රියා පිළිවෙත පැවැත්වෙන පරිශ්‍රයට මුද්‍රා තැබීමට ඒ පරීක්ෂක විසින් සැලැස්විය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ යම් පරිශ්‍රයකට මුද්‍රා තබනු ලබන අවස්ථාවක දී බලයලත් පරීක්ෂක විසින් ඒ බව වහාම සභාවට දැන්විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද මුද්‍රා තැබීමකට පසු දින හතක් ඇතුළත සභාව විසින් මහේස්ත්‍රාත් අධිකරණයකට ඉල්ලීමක් කර ඒ කරන ලද මුද්‍රා තැබීම තහවුරු කිරීමේ ආඥාවක් ලබා ගත යුතු ය.

(4) යම් ප්‍රභවයක් අනාරක්ෂිතව තිබෙන බව සහ ඒ ප්‍රභවයේ සුරක්ෂිතතාවයට හානිකර බාහිර බලපෑම් ඇතිවිය හැකි බව විශ්වාස කිරීමට බලයලත් පරීක්ෂකයකුට සාධාරණ හේතු තිබෙන විට, ඒ ප්‍රභවය, සභාව විසින් යෝජනා කරන වඩා ආරක්ෂිත ස්ථානයකට ගෙන යන ලෙස බලයලත් පරීක්ෂක විසින් බලපත්‍රලාභියාට විධානය කළ හැකි ය.

## IV වන පරිච්ඡේදය

## **ප්‍රභවයන්ගේ ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය**

විකිරණශීලී ප්‍රභවයන් වර්ගීකරණය කිරිම.

**42.** (1) විකිරණශීලී ප්‍රභවයන් ප්‍රවේසම් සහිතව කළමනාකරණය නොකළහොත් හෝ මැනවින් සුරක්ෂිත නොකළහොත් ජනතාවට සහ පරිසරයට එමගින් ඇතිවිය හැකි හානිය පදනම් කර ගෙන ජාත්‍යන්තරව පිළිගත් මාර්ගෝපදේශ අනුව සභාව විසින් විකිරණශීලී ප්‍රභවයන් වර්ගීකරණය කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද වර්ගීකරණය පිළිබඳ දැනුම් දීමක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

**43.** 11(ඇ) වගන්තිය යටතේ පවත්වා ගනු ලබන ප්‍රභවයන් පිළිබඳ ජාතික රෙජිස්ටරයෙහි අඩංගු තොරතුරු වල ප්‍රවේසම හා සුරක්ෂිතතාවය තහවුරු කිරීම පිණිස ඒ තොරතුරු ආරක්ෂා කිරීමට අවශ්‍ය සියළු පියවර සභාව විසින් ගනු ලැබිය යුතු ය.

ජාතික රෙජිස්ටරයේ අඩංගු ප්‍රභවයන් පිළිබඳ තොරතුරු ආරක්ෂා කිරීම.

**44.** විවිධ වර්ගවල විකිරණශීලි ප්‍රභවයන් භෞතික වශයෙන් ආරක්ෂා කිරීම පිණිස බලපත්‍රලාභීන් විසින් ඉටුකළ යුතු අවශ්‍යතා සහ එවැනි විවිධ වර්ගවල විකිරණශීලී ප්‍රභවයන්ගේ ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය සඳහා ගත යුතු පියවර සභාව විසින් නියම කළ හැකි ය.

විකිරණශීලී ප්‍රභව වර්ග භෞතික වශයෙන් ආරක්ෂා කිරීම.

**45.** (1) සෑම බලපත්‍රලාභියකු විසින්ම තැනැත්තන්ට සැළකිය යුතු තරම් හානි පැමිණවීමේ අවදානමක් ඇති කළ හැකි හෝ දේපලවලට හෝ පරිසරයට සැලකිය යුතු හානි පැමිණවිය හැකි තම විකිරණශීලී ප්‍රභවයක් විෂයෙහි පාලනය නැතිවීම හෝ තම විකිරණශීලී ප්‍රභවය සම්බන්ධයෙන් වෙනත් යම් සිදුවීමක් වූ වහාම ඒ බව සභාවට දැන්විය යුතු ය.

විකිරණශීලී ප්‍රභවයක පාලනය ගිලිහීයාම සභාවට දැනුම් දීමට බලපත්‍රලාභියාට ඇති යුතුකම.

(2) (1) වන උපවගන්තිය යටතේ පැනවෙන කාර්ය ඉටු කිරීම පැහැරහරින බලපත්‍රලාභියකු වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ළඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තුන් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වර්ෂ දෙකකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගතකිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

**46.** හිමිකම් නොමැති විකිරණශීලී ප්‍රභවයන් පිළිබඳ පාලනය නොපමාව ලබා ගැනීම හෝ නැවත ලබා ගැනීම සඳහා ජාතික ක්‍රමෝපායයක් සකස් කිරීම පිණිස සභාව ජාතික ආරක්ෂාව පිළිබඳ බලධාරීන් සහ වෙනත් අදාළ සංවිධාන සමඟ කටයුතු සම්බන්ධීකරණය කළ යුතු ය.

හිමිකම් නොමැති ප්‍රභවයන් පිළිබද ජාතික ක්‍රමෝපාය.

**47.** (1) සභාවේ ලිඛිත අනුමතය රහිතව කිසිම තැනැත්තෙකු විසින් ප්‍රවිකීරණ උපකරණ ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාවට ආනයනය කිරීම නොකළ යුතු ය.

ප්‍රවිකීරණ උපකරණ ආනයනය කිරීම සහ අපනයනය කිරීම.

(2) ප්‍රවිකිරණ උපකරණයක් අපනයනය කිරීමට හෝ ආනයනය කිරීමට (1) වන උපවගන්තිය යටතේ අනුමතයක් දීම මගින් ඒ ප්‍රවිකිරණ උපකරණය මේ පනතේ බලපත්‍රයක් ලබා ගත යුතුයයි නියමිත ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමේ කාර්ය සඳහා පාවිච්චි කිරීමට, සැපයීමට හෝ විකිණීමට අදහස් කරන අවස්ථාවක දී යෝග්‍ය බලපත්‍රයක් ලබාගත යුතු වීමෙන් අදාළ පුද්ගලයා නිදහස් කෙරෙතැයි නොසැලකිය යුතු ය.

විකිරණශීලී ප්‍රභවයන් ආනයනය කිරීම හෝ අපනයනය කිරීම.

**48.** (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, යම් විකිරණශීලී ප්‍රභවයක් හෝ එවැනි යම් ප්‍රභවයක් ඇතුළත් යම් උපකරණයක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට හෝ ශ්‍රී ලංකාව හරහා එවැනි යම් ප්‍රභවයක් ගෙනයාමට බලපත්‍රයක් හෝ වෙනත් යම් ආකාරයක අනුමතයක් දීමේ බලය දරන යම් තැනැත්තකු හෝ අධිකාරියක් විසින් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ඒ සඳහා ලබාගෙන මිස ඒ බලපත්‍රය නිකුත් කිරීම හෝ අනුමතය ලබා දීම නොකළ යුතු ය.

(2) (අ) සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ අනුමතයක් දීම සඳහා යොදා ගත යුතු අවශ්‍යතා සහ කාර්ය පටිපාටිය ජාත්‍යන්තරව පිළිගත් මාර්ගෝපදේශ පදනම් කර ගනිමින් සාදන ලද රීති මත පදනම් කර ගත යුතු ය.

(ආ) අදාළ විකිරණශීලී ප්‍රභවයේ හෝ ප්‍රභවය අඩංගු වෙනත් උපකරණයක ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය තහවුරු කිරීමෙහිලා අනුමතය ඉල්ලන තැනැත්තාගේ තත්වය හා හැකියාව ඇගයීම පිණිස තොරතුරු ඇගයීම සඳහා රීතිවලින් විධිවිධාන යෙදිය යුතු ය.

(3) 42 (1) වන වගන්තිය අනුව වර්ග කරන ලද විකිරණශීලී ප්‍රභවයන් අපනයනය කිරීම සඳහා වූ බලපත්‍රයකට හෝ වෙනත් ආකාරයේ අනුමතයකට සභාවේ අනුමතය ප්‍රදානය කිරීමට පෙර අදාළ ප්‍රභවය ප්‍රවේසම් සහිතව සහ සුරක්ෂිතව කළමනාකරණය කෙරෙන බව තහවුරු කිරීමට අවශ්‍ය යෝග්‍ය තාක්ෂණික සහ පරිපාලන හැකියාව, සම්පත් සහ නියාමන ව්‍යුහය, ආනයනය කරන රටේ ඇති බවට සභාව ප්‍රායෝගිකව හැකි තරම් දුරට සෑහීමට පත් විය යුතු ය.

V වන පරිච්ඡේදය

**න්‍යෂ්ටික සහ වෙනත් විකිරණශීලී ද්‍රව්‍යවල ආනයන හා අපනයන පාලනය**

**49.** (1) යම් න්‍යෂ්ටික ද්‍රව්‍ය, උපකරණ සහ තාක්ෂණයන් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම සහ ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම මේ පනත යටතේ පාලනයට යටත් වන අතර (මෙහි මින්මතු "පාලිත අයිතමයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) එම ද්‍රව්‍ය, උපකරණ සහ තාක්ෂණයන් පිළිබඳ ලැයිස්තුවක්, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බැඳීම් සහ එකඟවීම්වලට අනුකූලව ආරක්ෂණ ගිවිසුම යටතේ වූ බැඳීම් ඇතුළුව සභාව විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය.

පාලිත අයිතමයන්.

(2) එසේ පිළියෙල කරන ලද ලැයිස්තුවට ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් සභාව තීරණය කරන ආකාරයට සභාව විසින් දෙනු ලැබිය යුතු ය.

(3) ලැයිස්තුව ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

**50.** (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව තිබුණ ද සභාවේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව, කිසිම පාලිත අයිතමයක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට හෝ ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට කිසිම අනුමතයක්, බලයක් හෝ අවසරයක් ලබා නොදිය යුතු ය.

සභාවේ අනුමතය නොමැතිව පාලිත අයිතමයන් අපනයනය හෝ ආනයනය කිරීම තහනම් බව.

(2) (අ) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා වූ අනුමතය සභාව විසින් තීරණය කරනු ලබන ආකෘතියකින් සභාවට ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් සහ එසේම තීරණය කරන ගාස්තුව ගෙවීම මත ලබාගත යුතු ය.

(ආ) එසේ දෙනු ලබන අනුමතය, ආරක්ෂණ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ අවශ්‍යතා හා බැඳීම් මත පදනම් වූ සහ නියමිතව සඳහන් කරනු ලබන කොන්දේසිවලට යටත්ව විය යුතු ය.

(3) යම් පාලිත අයිතමයන් අපනයනය කිරීමට හෝ ආනයනය කිරීමට (1) වන උපවගන්තිය යටතේ අනුමතයක් ප්‍රදානය කිරීම මගින්, එම පාලිත අයිතමය ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමේ කාර්යය සඳහා පාවිච්චි කිරීමට, සන්තකයේ තබා ගැනීමට, ප්‍රවාහනය කිරීමට හෝ විකිණීමට අදහස් කෙරෙන අවස්ථාවකදී අදාළ තැනැත්තා විසින් මේ පනත යටතේ ඒ සඳහා යෝග්‍ය බලපත්‍රයක් ලබාගත යුතු වීමෙන් නිදහස් වූවායැයි නොසැලකිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් පාලිත අයිතමයක් ශ්‍රී ලංකාවට ආනයනය කරන හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන තැනැත්තෙකු වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදට වරදකරු කරනු ලැබූ විට, වෙනත් නීතියක් යටතේ වරදක් කිරීම සම්බන්ධයෙන් පනවනු ලැබිය හැකි වෙනත් දණ්ඩනයකට අමතරව, ඒ තැනැත්තා රුපියල් පන් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(5) යම් පාලිත අයිතමයක් රේගු ආඥා පනතේ යම් විධිවිධානයක් යටතේ රේගු නිලධරයෙකු විසින් තහනමට ගනු ලබන අවස්ථාවේ දී නොපමාව ඒ කරුණ සම්බන්ධව එම රේගු නිලධරයා විසින් සභාවට දැනුම් දිය යුතු අතර ඒ ආඥා පනතේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද ඒ තහනමට ගත් පාලිත අයිතමය පිළිබඳ පාලනය සභාවට ගැනීමටත් එහි ප්‍රවේසම සහ සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස එය සභාවේ පාලනය යටතේ වන පරිශ්‍රයක තබා ගැනීමටත් සභාවට බලය තිබිය යුතු ය.

පාලිත අයිතමයන් අපනයනය කිරීම සහ ආනයනය කිරීම සඳහා අනුමතය දීම සම්බන්ධයෙන් සභාව විසින් රීති සෑදිය යුතු බව.

**51.** යම් පාලිත අයිතමයන් අපනයනය කිරීම හෝ ආනයනය කිරීම සඳහා අනුමතය දීමේ දී සභාව විසින් අනුගමනය කළ යුතු යෝග්‍ය යැයි සභාව සලකන රීති, සභාව විසින් සාදනු ලැබිය හැකි ය.

න්‍යෂ්ටික ද්‍රව්‍ය ආනයනය සහ අපනයනය සම්බන්ධයෙන් සභාවේ කාර්යය.

**52.** (1) ආරක්ෂණ ගිවිසුමෙහි දක්වා ඇති න්‍යෂ්ටික ඉන්ධන චක්‍ර අදියරට පැමිණ නැති යුරේනියම් හෝ තෝරියම් අඩංගු යම් ද්‍රව්‍යයක් න්‍යෂ්ටික ආයුධ රාජ්‍යයක් නොවන රාජ්‍යයකට ශ්‍රී ලංකාවේ සිට සෘජුවම හෝ වක්‍රව අපනයනය කෙරෙන විට ඒ විකිරණශීලී ද්‍රව්‍ය අපනයනය කෙරෙන්නේ න්‍යෂ්ටික නොවන කාර්යයකට නම් මිස සභාව විසින් ඒ ද්‍රව්‍යයේ ප්‍රමාණය, සංයුතිය සහ ගමනාන්තය ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයට දැන්විය යුතු ය.

(2) ආරක්ෂණ ගිවිසුමෙහි දක්වා ඇති න්‍යෂ්ටික ඉන්ධන චක්‍ර අදියරට පැමිණ නැති යුරේනියම් හෝ තෝරියම් අඩංගු යම් ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාවට ආනයනය කෙරෙන විට ඒ ද්‍රව්‍ය ආනයනය කෙරෙන්නේ න්‍යෂ්ටික නොවන කාර්යයකට නම් මිස සභාව විසින් ඒ ද්‍රව්‍යයේ ප්‍රමාණය සහ සංයුතිය ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයට දැන්විය යුතු ය.

**53.** (1) ආරක්ෂණ ගිවිසුම අදාළ වන යම් න්‍යෂ්ටික ද්‍රව්‍යයක් ජාත්‍යන්තරව මාරුවීමේදී ඒ ද්‍රව්‍යය පිළිබඳ වගකීම පහත සඳහන් අවස්ථාවලදී සභාවේ වගකීම ලෙස සැලැකිය යුතු ය:- ආරක්ෂණ ගිවිසුම් යටතේ න්‍යෂ්ටික ද්‍රව්‍ය මාරුවීමේදී වගකීම මාරුවීම.

(අ) ආනයනයක් සම්බන්ධයෙන් වන විට වගකීම අපනයනය කරන රාජ්‍යය වෙත තීබීම අවසන් වන වේලාවේ සිට න්‍යෂ්ටික ද්‍රව්‍ය ශ්‍රී ලංකාවට සම්ප්‍රාප්ත වන වේලාව නොඉක්මවා; සහ

(ආ) අපනයනයක් සම්බන්ධයෙන් වන විට, එය ලබන රාජ්‍යය ඒ වගකීම භාරගන්නා වේලාව දක්වා සහ න්‍යෂ්ටික ද්‍රව්‍යය ගමනාන්තයට සම්ප්‍රාප්ත වන වේලාව නොඉක්මවා.

(2) න්‍යෂ්ටික ද්‍රව්‍යය ශ්‍රී ලංකාවේ භූමිය හෝ දේශීය ජල තීරය මත හෝ ඊට උඩින් අන් රටකට ගෙන යමින් තිබීම හෝ ඒ ද්‍රව්‍යය ශ්‍රී ලංකා ධජය යටතේ යාත්‍රාවක හෝ ශ්‍රී ලංකාවේ යම් ගුවන් යානයක ප්‍රවාහනය කෙරෙමින් තිබීම යන කාරණය නිසා පමණක් ඒ න්‍යෂ්ටික ද්‍රව්‍යය සම්බන්ධයෙන් සභාවට යම් වගකීමක් ඇතැයි නොසැලකිය යුතු ය.

(3) යම් න්‍යෂ්ටික ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම සම්බන්ධයෙන් (1) උපවගන්තියේ කාර්යය සඳහා සභාවේ වගකීම අවසාන වන අවස්ථාව ආරක්ෂණ ගිවිසුමට අනුකූලව සභාව විසින් තීරණය කරනු ලබන අවස්ථාව විය යුතු ය.

## VI වන පරිච්ඡේදය

## **විකිරණශීලී අපද්‍රව්‍ය**

54. විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ජාත්‍යන්තර සම්මතයන් මත පදනම්ව අමාත්‍යවරයා විසින් සකස් කරනු ලැබිය යුතු ය. ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රමෝපාය.

විකිරණශීලී අපද්‍රව්‍ය ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය.

**55.** (1) විකිරණශීලී අපද්‍රව්‍යයක සම්පූර්ණ ආයු කාලය තුළ එහි ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ මූලික වගකීම අදාළ බලපත්‍රලාභියා විසින් දැරිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පැනවී ඇති වගකීම ඉටු කිරීම පැහැර හරින බලපත්‍රලාභියකු වරදක් කරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදට වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

විකිරණශීලී අපද්‍රව්‍ය ආනයනය කිරීම.

**56.** (1) ශ්‍රී ලංකා ජනරජයෙන් පිටත ජනනය කරන ලද විකිරණශීලී අපද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීම, එම ආනයනය කිරීම ජාතියේ හිත පිණිස වේ යයි සභාව විමසා අමාත්‍යවරයා විසින් තීරණයක් කරනු ලැබ ඇත්නම් සහ ඒ සඳහා සභාවේ පූර්ව ලිඛිත අනුමතය දී ඇත්නම් මිස කරනු නොලැබිය යුතු ය.

(2) යම් තැනැත්තෙකු (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන්නේ නම් ඔහු වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදට වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

විකිරණශීලී අපද්‍රව්‍ය අපනයනය කිරීම.

**57.** (1) කිසිම තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකා ජනරජය ඇතුළත ජනනය කරන ලද විකිරණශීලී අපද්‍රව්‍ය අපනයනය කිරීම සභාවේ පූර්ව ලිඛිත අනුමතය සහ ආනයනය කරන රටේ කැමැත්ත ඇතිව මිස නොකළ යුතු ය.

(2) අක්ෂාංශ අංශක 60 ට දකුණින් පිහිටි ගමනාන්තයකට ගබඩා කිරීමේ හෝ බැහැර කිරීමේ කාර්ය සඳහා විකිරණශීලී අපද්‍රව්‍ය අපනයනය කිරීමට සභාව විසින් අනුමතය නොදිය යුතු ය.

(3) මෙහි (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තෙකු මේ පනත යටතේ වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදට වරදකරු කරනු ලැබූ විට ඒ තැනැත්තා රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

VII වන පරිච්ඡේදය

## ජාතික න්‍යෂ්ටික හදිසි අවස්ථා සැලැස්ම

**58.** (1) සභාව විසින් 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ විධිවිධානවලට අනුකූලව (මෙහි මින් මතු " හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්ම" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්මක් ජාතික මට්ටමේ විභව්‍ය න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි අවස්ථාවලදී ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කළ යුතු ය.

න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි අවස්ථා සඳහා වූ ජාතික සැලැස්ම.

(2) හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්ම සම්මත කර ගැනීම සම්බන්ධයෙන් 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි අවස්ථාවකදී 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ 8 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලබන මැදිහත් වීමකදී හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්ම ක්‍රියාවට නැංවීම පිණිස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සභාව විසින් ආධාර හා උපදෙස් ලබා දිය යුතු ය.

**59.** (1) ශ්‍රී ලංකා ජනරජයේ දේශසීමාවලින් ඔබ්බට විකිරණශීලී අපවිත්‍රනය පැතිරීමේ අවදානම ඇති කෙරෙන න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි අවස්ථාවක් උද්ගත වුවහොත් ඒ පිළිබඳව ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයට සහ ඒ අපවිත්‍රනයෙන් භෞතික බලපෑමක් ඇතිවිය හැකි යම් රාජ්‍යයක අදාළ අධිකාරීන්ට සභාව විසින් වහාම දැන්විය යුතු ය.

දේශ සීමාන්තර හදිසි අවස්ථා.

(2) න්‍යෂ්ටික අනතුරක් වහා දැනුම් දීම පිළිබඳ සම්මුතිය සහ න්‍යෂ්ටික අනතුරක් හෝ විකිරණශීලී හදිසි අවස්ථාවක් වූ විටක ආධාර කිරීම පිළිබඳ සම්මුතිය ඇතුළුව අදාළ ජාත්‍යන්තර සම්මුති අනුව න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි අවස්ථාවලදී යම් තොරතුරු හෝ ආධාර සැපයීම සඳහා වූ ඇමතුම් යොමුව වශයෙන් සභාව ක්‍රියා කළ යුතු ය.

VIII වන පරිච්ඡේදය

**ආරක්ෂණ විධිවිධාන කටයුතු**

සභාව විසින් ආරක්ෂණ විධි විධාන ගිවිසුමට අනුකූලවීම තහවුරු කළයුතු බව.

**60.** ආරක්ෂණ විධිවිධාන ගිවිසුම යටතේ ඇති කර ගන්නා ලද ශ්‍රී ලංකාවේ බැඳීම්වලට අනුකූලතාව දක්වන බවත් ඒ ගිවිසුම යථා පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු ආධාර ලබා දෙන බවත් සභාව විසින් තහවුරු කරනු ලැබිය යුතු ය.

න්‍යෂ්ටික ක්‍රියාකාරකම් සාමකාමී අරමුණු සඳහා පමණක් බව.

**61.** ශ්‍රී ලංකාවේ සියලු න්‍යෂ්ටික ක්‍රියාකාරකම් සාමකාමී අරමුණු සඳහා පමණක් සහ ඒ සම්බන්ධයෙන් වූ ශ්‍රී ලංකාවේ අදාළ ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූලව කරගෙන යා යුතු ය.

න්‍යෂ්ටික ආයුධ සහ වෙනත් පුපුරන උපකරණ පිළිබඳ තහනම.

**62.** (1) න්‍යෂ්ටික ආයුධ සහ වෙනත් න්‍යෂ්ටික පුපුරන උපකරණ ද ඒ ආයුධ හෝ උපකරණ විෂයෙහි සෘජු සහ වක්‍ර පාලනය ද ඒ ආයුධ හෝ උපකරණ නිපදවීම හෝ අත්කර ගැනීම ද ඒවා නිපදවීමට සහභාගීවීම, යම් ආධාරයක් ඉල්ලීම, දීම හෝ ලබා ගැනීම ද ශ්‍රී ලංකාවෙහි තහනම් වන්නේ ය.

(2) කිසිම තැනැත්තෙකු විසින් :-

(අ) න්‍යෂ්ටික ආයුධ පිළිබඳ පර්යේෂණ කිරීම, ඒවා වර්ධනය කිරීම, අත්කර ගැනීම, නිපදවීම, සන්තකයෙහි තබා ගැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, අන්සතු කිරීම හෝ පාවිච්චි කිරීම නොකළ යුතු ය;

(ආ) න්‍යෂ්ටික ආයුධ සෑදීමේ කාර්ය සඳහා න්‍යෂ්ටික ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම, ඒවා වර්ධනය කිරීම, අත්කර ගැනීම, නිපදවීම, සන්තකයෙහි තබා ගැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, අන්සතු කිරීම හෝ පාවිච්චි කිරීම නොකළ යුතු ය;

(ඇ) ඉහත (අ) හෝ (ආ) ඡේදයෙහි සඳහන් ක්‍රියාකාරකම්වලින් කිසිවකට සහභාගීවීම, ආධාර කිරීම හෝ මුදල් සැපයීම නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරන තැනැත්තෙකු වරදක් කරනු ලබන අතර මහාධිකරණය විසින් වරදට වරදකරු කරනු ලැබූ විට අවුරුදු විස්සකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

IX වන පරිච්ඡේදය

## න්‍යෂ්ටික ද්‍රව්‍ය හා වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ භෞතික ආරක්ෂාව

**63.** (1) සභාව විසින්, න්‍යෂ්ටික ද්‍රව්‍ය සහ වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ භෞතික ආරක්ෂාව සඳහා වූ පහත සඳහන් කරුණු ද ඇතුළත් අවශ්‍යතාවයන් සකස් කළ යුතු ය :- න්‍යෂ්ටික ද්‍රව්‍ය සහ වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ භෞතික ආරක්ෂාව සඳහා වන අවශ්‍යතාවයන්.

(අ) නියමිත වර්ගයක හෝ ප්‍රමාණයක ද්‍රව්‍ය සොරකම් කරනු ලැබීමෙන් හෝ බලපත්‍රලත් පාවිච්චියකින් වෙනත් දෙයකට හරවනු ලැබීමෙන් හෝ න්‍යෂ්ටික ද්‍රව්‍ය සහ වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය නිපදවෙන, පිරිසැකසෙන, පාවිච්චි කෙරෙන, පාලනය කෙරෙන, ගබඩා කරන හෝ බැහැර කරන ස්ථානයක් කඩාකප්පල් කිරීමෙන් සිදුවිය හැකි හානිය පිළිබඳ ඇගැයීමක් පදනම් කරගෙන න්‍යෂ්ටික ද්‍රව්‍ය සහ විකිරණශීලී ද්‍රව්‍ය වර්ග කිරීමක්;

(ආ) විවිධ වර්ගවල න්‍යෂ්ටික ද්‍රව්‍ය සහ විකිරණශීලී ද්‍රව්‍ය සඳහා අවශ්‍ය රැකවල් සහ සුරක්ෂිතතා පියවර; සහ

(ඇ) න්‍යෂ්ටික ද්‍රව්‍ය සහ වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය සඳහා ගිණුම්කරණ සහ පාලන පියවර.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන අවශ්‍යතා ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**64.** (1) බලපත්‍රලාභියකුට අයත් න්‍යෂ්ටික ද්‍රව්‍ය හෝ වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ සොරකමක්, කොල්ලයක් හෝ සොරකම් කිරීමේ හෝ කොල්ලකෑමේ තර්ජනයක් හෝ නැතිවීමක් සිදුවී තිබෙන විට ඒ බලපත්‍රලාභියා විසින් :- භෞතික ආරක්ෂාව සම්බන්ධයෙන් බලපත්‍රලාභීන්ගේ වගකීම.

(අ) සිද්ධිය සහ එහි අවස්ථානුගත කරුණු වහාම සභාවට දැන්විය යුතු ය;

(ආ) එසේ දැන්වීමෙන් පසු හැකි ඉක්මනින් සොරකම් කරනු ලැබූ හෝ නැතිවුණු න්‍යෂ්ටික ද්‍රව්‍ය සහ වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය පිළිබඳ විස්තර ද ඇතුළුව ලිඛිත වාර්තාවක් සභාවට සැපයිය යුතු ය;

(ඇ) සභාව නියම කරනු ලබන යම් අමතර තොරතුරු සැපයිය යුතු ය; සහ

(ඈ) සංවේදී තොරතුරුවල ප්‍රවේසම සහ රහස්‍යභාවය තහවුරු කිරීමට අවශ්‍ය සියලු පියවර ගත යුතු ය.

(2) මෙහි (1) වන උපවගන්තියෙන් පැනවෙන අවශ්‍යතාවයන්ට අනුකූලතාව නොදක්වන බලපත්‍රලාභියකු වරදක් කරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ දී පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ බලපත්‍රලාභියා යටත් විය යුතු ය.

ජාත්‍යන්තර සහයෝගය සහ සහය.

**65.** (1) ශ්‍රී ලංකාව ඇතුළත යම් න්‍යෂ්ටික ද්‍රව්‍යයක් හෝ විකිරණශීලී ද්‍රව්‍යයක් පිළිබඳ සොරකමක් හෝ කොල්ලයක් හෝ සොරකම් කිරීමේ හෝ කොල්ලකෑමේ ප්‍රයත්නයක් හෝ නැතිවීමක් සිදුවී තිබෙන විට ඒ සිද්ධිය නිසා බලපෑමක් ඇතිවිය හැකි වෙනත් රාජ්‍යයන්ට හෝ ජාත්‍යන්තර සංවිධානවලට සභාව විසින් හැකි ඉක්මනින් ඒ බව දැන්විය යුතු ය.

(2) යම් න්‍යෂ්ටික ද්‍රව්‍යයක් හෝ වෙනත් විකිරණශීලී ද්‍රව්‍යයක් පිළිබඳ සොරකමක් හෝ කොල්ලයක් හෝ නැතිවීමක් සිදුවූ අවස්ථාවකදී සභාව විසින් අදාළ දෙපාර්තමේන්තු සහ නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව ඒ ද්‍රව්‍ය ආපසු ලබා ගැනීම පිණිස අවශ්‍ය සියලු යෝග්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(3) යම් න්‍යෂ්ටික ද්‍රව්‍ය හෝ වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය සොරකම් කිරීම හෝ කොල්ලකෑම හෝ සොරකම් කිරීමට, කොල්ලකෑමට තැත් කිරීම හෝ නැතිවීම සම්බන්ධිත සිදුවීම් ගැන තොරතුරු ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය විසින් යොදා ඇති වැඩපිළිවෙල යටතේ ඒ නියෝජිතායතනයට ලබා දිය යුතු ය.

විකිරණශීලී ද්‍රව්‍ය හෝ න්‍යෂ්ටික ද්‍රව්‍ය හෝ විකිරණශීලී ද්‍රව්‍ය හෝ න්‍යෂ්ටික ද්‍රව්‍ය අඩංගු උපකරණයක් නීති විරෝධීව හසුරුවීම වරදක් බව.

**66.** (1) ඕනෑම කෙනෙකු —

(අ) යම් න්‍යෂ්ටික ද්‍රව්‍යයක් හෝ වෙනත් විකිරණශීලී ද්‍රව්‍යයක් හෝ න්‍යෂ්ටික ද්‍රව්‍ය හෝ වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය අඩංගු උපකරණයක් සොරකම් කිරීම හෝ කොල්ලකෑම, ඒ සඳහා ආධාර හා අනුබල දීම හෝ තැත් කිරීම;

(ආ) යම් න්‍යෂ්ටික ද්‍රව්‍යයක් හෝ වෙනත් විකිරණශීලී ද්‍රව්‍යයක් හෝ න්‍යෂ්ටික ද්‍රව්‍ය හෝ වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය අඩංගු උපකරණයක් අපහරණය කිරීම, ඒ සඳහා ආධාර හා අනුබල දීම හෝ තැත් කිරීම; හෝ

(ඇ) න්‍යෂ්ටික ද්‍රව්‍ය හෝ වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය නීත්‍යානුකූල අධිකාරී බලයක් නොමැතිව ශ්‍රී ලංකාව තුළට හෝ ඉන් පිටතට ගෙනයාමක්, යැවීමක් හෝ චලනය කිරීමක් වන්නාවූ යම් ක්‍රියාවක් කිරීම, ඒ සඳහා ආධාර හා අනුබල දීම හෝ තැත් කිරීම,

කරතොත් ඒ තැනැත්තා වරදක් කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදට වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකුගේ මරණය හෝ ශාරීරික හිංසනය ඇති කිරීමේ හෝ දේපලවලට හෝ පරිසරයට සැළකිය යුතු හානියක් කිරීමේ චේතනාවෙන් න්‍යෂ්ටික ද්‍රව්‍ය හෝ වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය ලබාගන්නා, සන්තකයේ තබාගන්නා, මාරුකරන, ප්‍රවාහනය කරන, වෙනස් කරන, පාවිච්චි කරන හෝ බැහැර කරන හෝ එවැනි ද්‍රව්‍ය අඩංගු උපකරණයක් සන්තකයේ තබා ගන්නා ඕනෑම කෙනෙකු වරදක් කරනු ලබන අතර මහාධිකරණය විසින් වරදට වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු විස්සකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(3) යම් තැනැත්තකුගේ මරණය හෝ ශාරීරික හිංසනය සිදු කරන හෝ සිදු කිරීමට ඉඩ ඇති හෝ දේපලවලට හෝ පරිසරයට සැළකිය යුතු හානියක් සිදුකරන හෝ සිදු කිරීමට ඉඩ ඇති න්‍යෂ්ටික ද්‍රව්‍යයක් හෝ වෙනත් විකිරණශීලී ද්‍රව්‍යයක් නීත්‍යනුකූල බලයක් නැතිව ලබාගන්නා, සන්තකයේ තබාගන්නා, මාරු කරන, ප්‍රවාහනය කරන, වෙනස් කරන, පාවිච්චි කරන හෝ බැහැර කරන හෝ එවැනි යම් ද්‍රව්‍යයක් අඩංගු උපකරණයක් සන්තකයෙහි තබාගන්නා ඕනෑම කෙනෙකු වරදක් කරනු ලබන අතර මහාධිකරණය විසින් වරදට වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු විස්සකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(4) යම් තැනැත්තකුට, ජාත්‍යන්තර සංවිධානයකට හෝ රාජ්‍යයකට, රටේ රාජ්‍ය ආරක්ෂාවට හෝ ජාතික ආරක්ෂාවට තර්ජනයක් ඇති කළ හැකි හෝ මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හානියක් කළ හැකි යම් ක්‍රියාවක් කරන ලෙස හෝ යම් ක්‍රියාවක් කිරීමෙන් වැළකී සිටින ලෙස බලකිරීම පිණිස (1), (2) හෝ (3) උපවගන්තීන්හි සඳහන් යම් වරදක් කරන හෝ කිරීමට තැත්කරන යම් කෙනෙකු වරදක් කරනු ලබන අතර මහාධිකරණය විසින් වරදට වරදකරු කරනු ලැබූ විට කරන ලද වරදේ බරපතලකමේ ස්වභාවය මත රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු විස්සකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතු ය.

(5) තර්ජනය කිරීමෙන් හෝ බලහත්කාරයෙන් හෝ වෙනත් ආකාරයක බියගැන්වීමකින් යම් විකිරණශීලී ද්‍රව්‍යයක් හෝ න්‍යෂ්ටික ද්‍රව්‍යයක් හෝ විකිරණශීලි ද්‍රව්‍ය හෝ න්‍යෂ්ටික ද්‍රව්‍ය අඩංගු උපකරණයක් ඉල්ලා සිටින්නා වූ කවරෙක් වුව ද වරදක් කරනු ලබන අතර මහාධිකරණය විසින් වරදට වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

67. (අ) යම් තැනැත්තකුගේ මරණය හෝ බරපතල ශාරීරික හිංසනය හෝ දේපලවලට හෝ පරිසරයට සැළකිය යුතු හානියක් සිදු කරන හෝ සිදු කිරීමට ඉඩ ඇති;

විකිරණශීලී ද්‍රව්‍ය හෝ න්‍යෂ්ටික ද්‍රව්‍ය හෝ ඒ ද්‍රව්‍ය අඩංගු උපකරණයක් නීත්‍යානුකූල නොවන ලෙස පාවිච්චි කිරීම වරදක් බව.

(ආ) යම් තැනැත්තකුට, ජාත්‍යන්තර සංවිධානයකට හෝ රාජ්‍යයක රටේ රාජ්‍ය ආරක්ෂාවට හෝ ජාතික ආරක්ෂාවට තර්ජනයක් ඇති කළ හැකි හෝ මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට යම් හානියක් සිදුකළ හැකි යම් ක්‍රියාවක් කරන ලෙස හෝ ක්‍රියාවක් කිරීමෙන් වැලකී සිටින ලෙස බලකිරීම සඳහා, නීත්‍යානුකූල බලයක් නැතිව විකිරණශීලී ද්‍රව්‍ය හෝ න්‍යෂ්ටික ද්‍රව්‍ය යම් ආකාරයෙන් පාවිච්චි කරන හෝ විසුරුවාහරින හෝ විකිරණශීලී ද්‍රව්‍ය හෝ න්‍යෂ්ටික ද්‍රව්‍ය අඩංගු උපකරණයක් පාවිච්චි කරන; හෝ

(ඇ) (අ) ජේදයේ හෝ (ආ) ජේදයේ සඳහන් ක්‍රියාවක් කිරීමට තර්ජනය කරන,

ඕනෑම කෙනෙකු වරදක් කරනු ලබන අතර මහාධිකරණය විසින් වරදට වරදකරු කරනු ලැබූ විට අවුරුදු විස්සකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

68. (1) ඕනෑම කෙනෙකු තම ක්‍රියාවෙන් වෙනත් තැනැත්තකුට මරණය හෝ ශාරීරික හිංසනය සිදු කෙරෙතැයි හෝ දේපලවලට හෝ පරිසරයට සැළකිය යුතු හානියක් සිදුකෙරෙතැයි යන චේතනාවෙන් හෝ දැනුමින් යුතුව ප්‍රවිකිරණ කාර්මික අනු ආයතනයක් විකිරණශීලි ද්‍රව්‍ය මුදාහැරීමට හෝ මුදාහැරීමේ අවදානමට හේතුවන ආකාරයෙන් පාවිච්චි කරන හෝ ඊට හානි කරන අවස්ථාවක වරදක් කරනු ලබන අතර මහාධිකරණය විසින් වරදට වරදකරු කරනු ලැබූ විට අවුරුදු විස්සකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

විකිරණශීලී ද්‍රව්‍ය මුදාහැරීමේ අවදානම ඇති කෙරෙමින් ප්‍රවිකිරණ කාර්මික අනු ආයතනයක් පාවිච්චි කිරීම හෝ ඒවාට හානි කිරීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ක්‍රියාවක් කිරීමට තර්ජනය කරන ඕනෑම කෙනෙකු වරදක් කරනු ලබන අතර වරදට වරදකරු කරනු ලැබීමේ දී (1) වන උපවගන්තියෙහි සඳහන් දඬුවමට යටත් විය යුතු ය.

X වන පරිච්ඡේදය

**කැණීම සහ පිරිසැකසුම**

කැණීම් සහ පිරිසැකසුම් මෙහෙයුම්වලට අදාළ ක්‍රියාකාරකම් වලදී ආරක්ෂාව සැලසීම.

**69.** (1) අයනීකාර ද්‍රව්‍ය උපද්දන කැණීම් හා පිරිසැකසුම් මෙහෙයුම්වලට අදාළ ක්‍රියාකාරකම් පවත්වන සියලු පුද්ගලයන් විසින් අනුකූලතාව දැක්විය යුතු, කම්කරුවන්, මහජනයා සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා වූ අවශ්‍යතා සභාව විසින් තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් පැනවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පැනවුණු යම් අවශ්‍යතාවයන් අනුව ක්‍රියා කළ යුතුයයි නියමිත සහ ඒ අවශ්‍යතාවයන් අනුව ක්‍රියා කිරීමට අසමත් වන තැනැත්තකු වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබීමේදී රුපියල් පන් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

## III වන කොටස

### XI වන පරිච්ඡේදය

**මණ්ඩලයේ සහ සභාවේ කාර්ය මණ්ඩලය**

මේ කොටසේ යෙදෙන "අදාළ අධිකාරිය" යන්නෙහි අර්ථය.

**70.** මේ පනතේ මේ කොටසේ (XI, XII, XIII වන පරිච්ඡේදවල) කාර්ය සඳහා "අදාළ අධිකාරිය" යන්නෙන් අවස්ථාවෝචිත පරිදි මණ්ඩලය හෝ සභාව අදහස් වේ.

අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරීම.

**71.** (1) අමාත්‍යවරයා විසින් අදාළ අධිකාරිය විමසා ඒ ආකාරයෙන්ම තීරණය කරනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව, (මේ පරිච්ඡේදයෙහි "අධ්‍යක්ෂ - ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන)

(අ) න්‍යෂ්ටික විද්‍යා සහ තාක්ෂණවේදී ක්ෂේත්‍රයෙහි ශාස්ත්‍රීය සුදුසුකම් හා පුළුල් පළපුරුද්දක් ඇති තැනැත්තකු මණ්ඩලයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා වශයෙන්; සහ

(ආ) පරමාණුක ශක්ති නියාමන කරුණු , විකිරණ ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය, පරිපාලනය හෝ නීතිය ක්ෂේත්‍රයන්හි ශාස්ත්‍රීය සුදුසුකම් සහ පුළුල් පළපුරුද්ද ඇති තැනැත්තකු සභාවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා වශයෙන්,

පත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදාළ අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, එම අධිකාරියේ පොදු විධානවලට යටත්ව,

(අ) අදාළ අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම, එහි සංවිධානය, එහි බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීමට; සහ

(ආ) අදාළ අධිකාරියේ නිලධරයන් සහ සේවා නියුක්තිකයන් පිළිබඳ සාමාන්‍ය පාලනය ක්‍රියාත්මක කිරීමට,

වගකිව යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන කාල පරිච්ඡේදයක් සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා පත් කරනු ලැබිය යුතු අතර ඒ කාලපරිච්ඡේදය, පත්කිරීමේ දිනයේ සිට අවුරුදු පහකට වැඩි නොවිය යුතු අතර අධ්‍යක්ෂ-ජනරාල්වරයා ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස අමාත්‍යවරයා විසින් අදාළ අධිකාරිය විමසා අධ්‍යක්ෂ-ජනරාල්වරයා වශයෙන් ඔහුගේ කාර්ය සාධනය සැලකිල්ලට ගෙන නැවත පත් කරනු ලැබිය හැකි ය.

(4) අදාල අධිකාරියේ නිලධරයකු එහි අධ්‍යක්ෂ-ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලබන අවස්ථාවක දී අධ්‍යක්ෂ-ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබූ වේලාවේදී ඒ නිලධරයා දරමින් සිටි තනතුරින් ඔහු අධ්‍යක්ෂ-ජනරාල්වරයා වශයෙන් ධූරය දරන කාල පරිච්ඡේදය සඳහා නිදහස් කරනු ලැබිය යුතු ය.

(5) (අ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අදාළ අධිකාරියේ ලිඛිත අනුමතය ඇතිව තම බලතල සහ කර්තව්‍ය අතුරින් පැවරිය යුතු යයි ඔහු සලකන කර්තව්‍ය හා බලතල අදාළ අධිකාරියේ යම් නිලධරයෙකුට ලියවිල්ලකින් පවරනු ලැබිය හැකි ය.

(ආ) එවැනි බලයක් හෝ කර්තව්‍යයක් පවරනු ලැබූ නිලධරයා විසින් ඒ බලය ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍යය ඉටු කිරීම අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ විධානයන්ට යටත්ව කරනු ලැබිය යුතු ය.

(6) අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදාළ අධිකාරියේ රැස්වීම්වලට සහභාගී විය යුතු වුව ද ඒ කිසි රැස්වීමක දී ඡන්දය දීමේ අයිතිවාසිකමක් ඔහුට නොලැබිය යුතු ය.

අධ්‍යක්ෂ-ජනරාල්වරයා ඉවත් කිරීම.

**72.** (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා—

(අ) ඔහුගේ ධූරයේ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමට ස්ථිර වශයෙන්ම කළ නොහැකි බවට පත්වුවහොත්;

(ආ) අදාළ අධිකාරියේ අරමුණුවලට පැහැදිලිවම ප්‍රතිවිරුද්ධ ක්‍රියාවක් කර ඇතොත් හෝ අධිකාරිය සැලකිල්ලක් දක්වන කරුණුවලට අනර්ථදායී ලෙස ක්‍රියාකර ඇතොත්; හෝ

(ඇ) අදාළ අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් විධානයක් අනුව ක්‍රියාකිරීමට අපොහොසත් වුවහොත්,

අදාළ අධිකාරිය විසින් යෝග්‍ය පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු කරනු ලබන නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ධූරයෙන් ඉවත් කරනු ලැබූ විට, එම නිලධරයා අධ්‍යක්ෂ-ජනරාල් ධූරයට පත්වීමට පෙර දරමින් සිටින ලද ධූරයට එම නිලධරයාට හිමි අයිතිවාසිකමක් වශයෙන් නැවත පත්වීමට හිමිකමක් නොලැබිය යුතු ය.

අදාළ අධිකාරියේ කාර්ය මණ්ඩලය පත් කිරීම.

**73.** (1) අදාළ අධිකාරිය විසින් එහි කාර්ය මණ්ඩලයට එය උචිත යයි සලකනු ලබන පරිදි නිලධරයන් සහ සේවකයන් පත්කිරීම, ඒ නිලධරයන් සහ සේවකයන් පිළිබඳ විනය පාලනය, සේවයට අදාලව අදාළ අධිකාරිය තීරණය කරනු ලබන නියමයන් සහ කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට අමාත්‍යවරයා විමසා මුදල් විෂයය භාර

අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අදාළ අධිකාරිය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් සහ වෙනත් ප්‍රතිලාභ ගෙවනු ලැබිය යුතු ය.

(3) අදාළ අධිකාරිය විසින් එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ යහපත උදෙසා අර්ථ සාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවා නියාමනය කළ යුතු අතර ඒ අරමුදල් හෝ යෝජනා ක්‍රම සඳහා දායක මුදල් ගෙවනු ලැබිය යුතු ය.

අදාල අධිකාරියේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

**74.** (1) අදාළ අධිකාරියේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව අදාළ අධිකාරිය විසින් තීරණය කළ හැකි කාලයකට ඒ අදාළ අධිකාරියේ කාර්ය මණ්ඩලය තාවකාලිකව පත්කිරීම හෝ ඔවුන්ගේ කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කිරිම හෝ කළ හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අදාළ අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලබන අවස්ථාවක දී 1991 අංක 37 දරන ජාතික ප්‍රවාහන කොමිෂන් සභා පනතේ 14 (2) වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ නිලධරයකු අදාල අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලබන අවස්ථාවක දී 1991 අංක 37 දරන ජාතික ප්‍රවාහන කොමිෂන් සභා පනතේ 14 (3) වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදයක් සේවය කිරීමට ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹී සිටින තැනැත්තකු අදාළ අධිකාරිය විසින් සේවයට බඳවා ගනු ලබන අවස්ථාවක දී අදාළ අධිකාරියට සේවය කරන යම් කාල පරිච්ඡේදයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීම සඳහා රජයට සේවය කිරීමක් ලෙස සැලකිය යුතු ය.

XII වන පරිච්ඡේදය

## අදාළ අධිකාරියේ මූල්‍ය කටයුතු

අදාළ අධිකාරියේ අරමුදල.

**75.** (1) අදාළ අධිකාරියට ඊටම අයත් අරමුදලක් තිබිය යුතුය. පහත සඳහන් මුදල් ඊට බැර කරනු ලැබිය යුතු යඃ-

(අ) අදාළ අධිකාරියේ ප්‍රයෝජනය සඳහා කලින් කලට පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) මේ පනත යටතේ තම බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටුකිරීමේ දී අදාළ අධිකාරියට ලැබෙන සියලු මුදල්;

(ඇ) (2) වන වගන්තියේ විධිවිධානයට යටත්ව ශ්‍රී ලංකාව ඇතුළත හෝ පිටත කවර හෝ ප්‍රභවයකින් අදාළ අධිකාරියට ණය, පරිත්‍යාග, ත්‍යාග, රික්තවරණ හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල්ඃ

එසේ වුව ද, අදාළ අධිකාරිය වෙත ලබාදෙනු ලබන විදේශීය ණය, ප්‍රදාන, ත්‍යාග සහ පරිත්‍යාග සම්බන්ධයෙන් අදාළ අධිකාරිය විසින් මුදල් විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අවසරය ලබාගත යුතු අතර, ශ්‍රී ලංකාව ඇතුළත කවර හෝ ප්‍රභවයකින් අදාළ අධිකාරියට ණය, පරිත්‍යාග, ත්‍යාග, රික්තවරණ සහ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, ඉන්පසුව, පාර්ලිමේන්තුවේ අනුමතය ඇතිව අදාළ අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය; සහ

(ඈ) මේ පනත යටතේ අය කරනු ලබන ගාස්තු හෝ අයකිරීම් වශයෙන් අදාළ අධිකාරියට ලැබෙන සියලු මුදල්.

(2) අදාළ අධිකාරියේ ස්වාධීනත්වය අපකීර්තියට හෝ අවදානමට භාජන කරන්නා වූ හෝ මේ පනතින් හෝ ඒ යටතේ යම් නියාමන කර්තව්‍යයක් හෝ කාර්යයක් ඉටුකිරීමට බාධාවක් වන්නා වූ යම් මුදලක්, ණයක්, පරිත්‍යාගයක්, ත්‍යාගයක්, රික්තවරණයක් හෝ ප්‍රදානයක් වශයෙන් බලපත්‍රලාභියකුගෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් හෝ ලබා නොගත යුතු ය.

(3) මේ පනත යටතේ අදාළ අධිකාරියේ බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටුකිරීමේ දී අදාළ අධිකාරිය විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අදාළ අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**76.** (1) අදාළ අධිකාරියක් විසින් එහි වත්කම් හා වගකීම්, අදායම සහ වියදම සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතු ය.

අදාළ අධිකාරියේ ගිණුම් විගණනය කිරීම.

(2) අදාළ අධිකාරියක මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) අදාළ අධිකාරියක ගිණුම් විගණනය කිරීම කෙරෙහි සහ ඒ සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

(4) 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ අධිකාරියක මූල්‍ය පාලනය සහ ගිණුම් කෙරෙහි සහ ඒවා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

XIII වන පරිච්ඡේදය

**විවිධ**

**77.** (1) අදාළ අධිකාරිය විසින් ඇති කරගත් හෝ ඇති කර ගැනීමට යෝජිත යම් ගිවිසුමක් පිළිබඳව සෘජුව හෝ වක්‍ර ලෙස සම්බන්ධතාවක් ඇති ඒ අදාළ අධිකාරියේ සාමාජිකයකු විසින් ඒ කාරණය දැනගැනීමට ලැබුණු පසු හැකි ඉක්මනින් අදාළ අධිකාරියේ රැස්වීමක දී එය සම්බන්ධතාවේ සත්‍යතාවය හෙළිදරව් කළ යුතු ය.

අදාළ අධිකාරිය විසින් ඇති කරගන්නා ලද හෝ ඇති කරගැනීමට යෝජිත ගිවිසුමක් පිළිබඳ සම්බන්ධතා හෙළිකිරීම.

(2) අදාළ අධිකාරියේ සාමාජිකයකු විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් හෙළිදරව් කිරීමක් ඒ අදාළ අධිකාරියේ රැස්වීමේ කාර්ය සටහන්වල ලේඛනගත කළ යුතු අතර එකී සාමාජිකයාː-

(අ) හෙළිදරව් කිරීම අදාළ ගිවිසුම පිළිබඳව අදාළ අධිකාරියේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගී නොවිය යුතු ය; සහ

(ආ) ඒ සාකච්ඡාව හෝ තීරණය ගැනීම සිදුවන අදාළ අධිකාරියේ රැස්වීමක් සඳහා වූ ගණපූරණය සංයුක්ත කිරීම පිණිස සැලකිල්ලට නොගත යුතු ය.

අදාළ අධිකාරියක් සඳහා ඉඩම් අත්කර ගැනීම.

**78.** අදාළ අධිකාරියේ යම් කාර්යයක් සඳහා යම් ඉඩමක් අවශ්‍ය කෙරෙන විට ඒ කාර්යය (460 වන අධිකාරය වන) ඉඩම් අත්කර ගැනීමේ පනතේ කාර්ය සඳහා පොදු කාර්යයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ අනුව එම ඉඩම රජය විසින් අදාළ අධිකාරිය සඳහා ඒ පනත යටතේ අත්කර ගත හැකි අතර ඒ අත්කරගැනීම කෙරෙහි සහ ඒ සම්බන්ධයෙන් ඒ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

අදාළ අධිකාරියේ සාමාජිකයන් සහ නිලධරයන් සිවිල් හෝ අපරාධ නඩුවලින් ආරක්ෂා කිරීම.

**79.** (1) අදාළ අධිකාරියේ යම් සාමාජිකයකු හෝ නිලධරයෙකු හෝ ඒ සාමාජිකයා හෝ නිලධරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයෙකු විසින් මේ පනත යටතේ අදාළ අධිකාරියට නියම කරනු ලැබූ හෝ පවරනු ලැබූ කර්තව්‍යයක් හෝ බලයක් ඉටුකිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී සද්භාවයෙන් කරන ලද කවර වූ ක්‍රියාවක් හේතුකොටගෙන ඒ සාමාජිකයා හෝ නිලධරයා කිසිදු සිවිල් හෝ අපරාධ වගකීමකට යටත් නොවිය යුතු ය.

(2) අදාළ අධිකාරිය විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරන ලද නඩුවක දී අදාළ අධිකාරිය විසින් දරන ලද වියදම් අදාළ අධිකාරියේ අරමුදලින් පියවිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අදාළ අධිකාරියට ගෙවනු ලැබූ හෝ ඒ අධිකාරිය විසින් අයකරගනු ලැබූ ගාස්තු අදාළ අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය.

(3) අදාළ අධිකාරියේ සාමාජිකයකුට හෝ නිලධරයකුට හෝ එවැනි සාමාජිකයකු හෝ නිලධරයකු විසින් නිසි ලෙස බලය පවරන ලද නිලධරයකුට හෝ විරුද්ධව අවස්ථාවෝචිත පරිදි මේ පනත යටතේ ඔහු විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ සාමාජිකයා හෝ නිලධරයා විසින් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි තීරණය කළහොත් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් ඒ වියදම් අයකර ගතහොත් හැර අදාළ අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු ය.

වැරදි සහ දණ්ඩන.

**80.** (1) සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු විසින් මේ පනත යටතේ යම් බලයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටුකිරීමේ දී ඊට මැදිහත් වීමක් හෝ බාධාකිරීමක් වන ක්‍රියාවක් කිරීම හෝ ඒ සාමාජිකයා හෝ නිලධරයා කෙරෙහි යම් අනිසි බලපෑමක් හෝ බලහත්කාරකමක් කිරීම යම් තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) (අ) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් රීතියක් හෝ නියෝගයක් යටතේ යම් කාර්යයක්, කර්තව්‍යයක් හෝ බලයක් ඉටුකරන හෝ ක්‍රියාත්මක කරන අදාළ අධිකාරියේ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට සිතාමතාම අවහිර කරන හෝ බාධාකරන අවස්ථාවක දී;

(ආ) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද රීතියක් හෝ නියෝගයක් යටතේ නියමිත තොරතුරක් ඒ තොරතුර අසත්‍ය බව හෝ යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් නොමග යවන බව දැනදැනම ඉදිරිපත් කරන අවස්ථාවක දී; හෝ

(ඇ) අදාළ අධිකාරියේ යම් තීරණයකට පටහැනිව හෝ මේ පනතේ විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද රීතියක් හෝ නියෝගයක් උල්ලංඝනය වන සේ ක්‍රියා කරන අවස්ථාවක දී,

යම් තැනැත්තකු වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලද ලඝු නඩු විභාගයකින් පසුව වරදට වරදකරු කරනු ලැබීමේ දී ඒ වරද සඳහා මේ පනතෙහි හෝ අදාල නීතියේ හෝ රෙගුලාසියේ කිසිදු දණ්ඩනයක් ප්‍රකාශිතව දක්වා නැති නම් රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

සංස්ථාවක් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් කරනු ලබන වැරදි.

**81.** මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රීතියක් හෝ නියෝගයක් යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන අවස්ථාවක දී ඒ පුද්ගල මණ්ඩලය;

(අ) සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙකු හා නිලධරයකුම; හෝ

(ආ) හවුල් ව්‍යාපාරයක් නම් ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකුම,

ඒ වරදට වරදකරු විය යුතු යඃ

එසේ වුවද, සංස්ථාවක අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු හෝ අවස්ථාචෝචිත පරිදි ඒ වරද කරන ලද්දේ තමාගේ දැනුමින් තොරව බව හෝ ඒ වරද කිරීම

වැළැක්වීමට අවශ්‍ය නිසි උද්යෝගයෙන් යුතුව තමා ක්‍රියාකළ බව අධිකරණය සෑහීමකට පත්වන පරිදි ඔප්පු කළහොත් ඔහු හෝ ඇය ඒ වරදට වරදකරු ලෙස සළකනු නොලැබිය යුතු ය.

රහස්‍යතා ප්‍රකාශය.

**82.** (1) මේ පනත යටතේ පිහිටුවන ලද අදාළ අධිකාරියේ සෑම කමිටුවක, උපදේශක කමිටුවක සහ අභියාචනා කමිටුවක සාමාජිකයකු සහ සෑම විශේෂඥයකු, බලයලත් පරීක්ෂකයකු සහ අදාළ අධිකාරියේ සියලු නිලධරයන් තම කාර්ය භාරගැනීමට පෙර අදාළ අධිකාරියේ වැඩ කටයුතු සම්බන්ධයෙන් වූ සියලු කරුණු පිළිබඳ සම්පූර්ණ රහස්‍යතාව රකින බවට ප්‍රතිඥා දෙමින් ප්‍රකාශයකට අත්සන් කළ යුතු අතර, ඒ ප්‍රකාශයෙන් මේ පනත යටතේ තම කාර්ය හෝ කර්තව්‍ය ඉටුකිරීමේ දී තමාට දැනගන්නට ලැබෙන කිසිම තොරතුරක්;

(අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක් හෝ නියෝගයක් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් පිළිපැදීම පිණිස; හෝ

(ආ) අධිකරණයක් විසින් නියම කරන ලද විට,

හැර හෙළිදරව් නොකරන බවට ප්‍රතිඥාවක් දිය යුතු ය.

(2) මේ පනත යටතේ පිහිටුවන ලද අදාළ අධිකාරියේ කමිටුවක, උපදේශක කමිටුවක සහ අභියාචන කමිටුවක සාමාජිකයකුට හෝ විශේෂඥයකුට හෝ බලයලත් පරීක්ෂකවරයකුට හෝ අදාළ අධිකාරියේ යම් නිලධරයකුට 2002 අංක 36 දරන බුද්ධිමය දේපල පනත මගින් හෝ එය යටතේ යම් තැනැත්තකුට පිරිනමා ඇති අයිතිවාසිකම් කඩකරමින් යම් තොරතුරක් එළිදරව් කිරීමට හෝ යම් ක්‍රියාවක් කිරීමට බලය දීමක් ලෙස මේ වගන්තියේ පූර්වයෙන් වූ විධිවිධානවල කිසිවක් අර්ථ කථනය නොකළ යුතු ය.

82 වන වගන්තිය උල්ලංඝනය කිරීම වරදක් බව.

**83.** මේ පනතේ 82 (1) වගන්තිය උල්ලංඝනය කරන, මේ පනත යටතේ පිහිටුවන ලද අදාළ අධිකාරියේ යම් කමිටුවක, උපදේශක කමිටුවක හෝ අභියාචනා කමිටුවක සාමාජිකයකු හෝ අදාළ අධිකාරියේ විශේෂඥයකු, බලයලත් නිලධරයකු හෝ යම් නිලධරයකු වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු

ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ එක් වර්ෂයකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

**84.** අදාළ අධිකාරියේ සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් වශයෙන් සළකනු ලැබිය යුතු ය.

අදාළ අධිකාරියේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සැළකෙන බව.

**85.** අල්ලස් පනතේ අර්ථානුකූලව අදාළ අධිකාරිය උපලේඛනගත ආයතනයක් වශයෙන් සළකනු ලබන අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථකථනය කළ යුතු ය.

අල්ලස් පනතේ කාර්ය සඳහා අදාළ අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සැළකෙන බව.

**86.** (1) අමාත්‍යවරයා විසින්, මේ පනත යටතේ නියම කරනු ලැබීමට නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් ද, මේ පනත යටතේ නියෝග සෑදීමට බලය දෙනු ලැබූ සියලු කාරණා සම්බන්ධයෙන් ද, නියෝග සාදනු ලැබිය හැකිය.

නියෝග.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තිය මගින් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි යः-

(අ) විකිරණශීලී ද්‍රව්‍ය හෝ විකිරණශීලී ප්‍රභවයන් අපනයනය කිරීම, ආනයනය කිරීම, ප්‍රතිඅපනයනය කිරීම, ගබඩා කිරීම, කැණීම, පිරිසැකසීම, සැළසුම් කිරීම, නිෂ්පාදනය කිරීම, ඉදිකිරීම, කොටස් එකලස් කිරීම, ලබා ගැනීම, බෙදා හැරීම, විකිණීම, කල් බදු ගැනීම, කුලියට ගැනීම,

ලබා ගැනීම, ස්ථානගත කිරීම, පිහිටි ස්ථානය සොයා ගැනීම, ක්‍රියාත්මක වීම, සන්තකයේ තබා ගැනීම, අක්‍රීය කිරීම, කොටස් ගැලවීම, පාවිච්චි කිරීම හෝ බැහැර කිරීම සහ ප්‍රවිකිරණ උපකරණ සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම, විකිණීම, ස්ථානය සොයා ගැනීම, නිෂ්පාදනය කිරීම, සන්තකයේ තබා ගැනීම, පාවිච්චි කිරීම, අපනයනය කිරීම හෝ ආනයනය කිරීම යන කටයුතු නියාමනය කිරීම;

(ආ) ප්‍රවිකිරණ කාර්මික අනු ආයතන අක්‍රීය කිරීම;

(ඇ) වෛද්‍ය සුපරීක්ෂණය සහ අයනීකාර විකිරණයට වෘත්තීය නිරාවරණය ඇතුළුව අයනීකාර විකිරණයේ හානිකර බලපෑමෙන් විකිරණ සේවකයන් ආරක්ෂා කිරීම;

(ඈ) අයනීකාර විකිරණයේ හානිකර බලපෑමෙන් සාමාන්‍ය ජනතාව සහ පරිසරය ආරක්ෂා කිරීම;

(ඉ) රෝගීන් ආරක්ෂා කිරීම ඇතුළුව අයනීකාර විකිරණය සම්බන්ධිත වෛද්‍ය සේවා නියාමනය කිරීම;

(ඊ) අපද්‍රව්‍ය පරිසරයට මුදාහැරීම, මහජන සෞඛ්‍යය සහ ප්‍රවේසම කෙරෙහි බලපෑ හැකි යම් භාවිතයක් ඇතුළුව විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය නියාමනය කිරීම;

(උ) විකිරණශීලී ප්‍රභවයන්ගේ සහ පාලිත අයිතමයන්ගේ සුරක්ෂිතභාවය; සහ

(ඌ) අයනීකාර විකිරණයට නිරාවරණය වීම හේතු කොට සිදුවන හානියක්, රෝගයක් හෝ අලාභයක් වෙනුවෙන් විකිරණ සේවකයන්ට වන්දි ගෙවීම සඳහා වන්දි යෝජනා ක්‍රමයක් සකස් කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, ඒ නියෝග එසේ පළකිරීමේ දිනයේ දී හෝ ඒ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කෙරෙන පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු පහසු පරිදි හැකි තරම් ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු

ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ අනනුමතයේ දින පටන් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරන ලද සේ සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

87. (1) මේ කොටස යටතේ සභාවට රීති සෑදීමට බලය දෙන ලද හෝ නියම කරන ලද සියලු කරුණු හෝ යම් කරුණක් සම්බන්ධයෙන් සහ විශේෂ වශයෙන් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි යː- රීති.

(අ) විකිරණශීලී ද්‍රව්‍ය සහ විකිරිණශීලී අපද්‍රව්‍ය ශ්‍රී ලංකා ජනරජයට, ඉන් පිටතට සහ එය ඇතුළත ප්‍රවාහනය කිරීම සඳහා පිළිපැදිය යුතු පහත සඳහන් කරුණු ඇතුළත් අවශ්‍යතාවයන්ː-

(i) අදාල විකිරණශීලී ද්‍රව්‍යයේ වර්ග, ප්‍රමාණ සහ සක්‍රීයතා මට්ටම් මත විභව්‍ය විය හැකි උපද්‍රව සැළකිල්ලට ගනිමින් විකිරණශීලී ද්‍රව්‍ය වර්ග කිරීමක් ඇතුළත් කිරිම;

(ii) විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවේසම් සහිතව ප්‍රවාහනය කිරීම පිළිබඳ ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ නියෝගවලට අනුකූල වීම;

(iii) ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය විසින් නියම කර ඇති ප්‍රමිතිවලට අනුකූලව විකිරණශීලී ද්‍රව්‍යවල භෞතික ආරක්ෂාව සඳහා වූ පියවර ඇතුළත් කිරිම.

(ආ) ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය නිර්දේශ කර තිබෙන බැහැර කිරීම් නිශ්චිතව දැක්වීම;

(ඇ) න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි අවස්ථා තත්ත්වයන්ට සූදානම්ව සිටීම සහ ප්‍රතිචාර දැක්වීම;

(ඈ) විකිරණ සේවකයන්ගේ සුදුසුකම් සඳහා උපමාන;

(ඉ) පොදු ජනතාව විසින් පාවිච්චි කරනු ලබන ආහාර සහ වෙනත් යම් ද්‍රව්‍යවල විකිරණශීලී සාන්ද්‍රන මට්ටම් නියම කිරීම;

(ඊ) පොදු ජනතාව විසින් පාවිච්චි කරනු ලබන ආහාර සහ අනිකුත් ද්‍රව්‍ය වල තිබිය යුතු මට්ටම ඉක්මවා එම ආහාර සහ අනිකුත් ද්‍රව්‍ය ශ්‍රී ලංකාවට ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළ නිපදවීම හෝ ප්‍රචාරණය කිරීම තහනම් කළ යුතු විකිරණශීලී සාන්ද්‍රණ මට්ටම් නියම කිරීම;

(උ) න්‍යෂ්ටික තාක්ෂණය සාමකාමී ප්‍රයෝජන සඳහා යොදාගැනීම ඇතුළුව විකිරණ ආරක්ෂාව, ප්‍රවේසම සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති, සම්මත සහ ප්‍රමිති චර්යා සංග්‍රහ ඇති කිරීම; සහ

(ඌ) මේ පනතින් හෝ මේ පනත යටතේ නිශ්චිත විධිවිධාන සලසා නැති ආරක්ෂණ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි සැළකෙන අවශ්‍යතාවයන්.

(2) මණ්ඩලය විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැයට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ රීති එසේ පළකිරීමේ දිනයේ දී හෝ ඒ රීතියෙහි නිශ්චිතව සඳහන් කෙරෙන පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) මණ්ඩලය විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු පහසු පරිදි හැකි ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් රීතියක් ඒ අනනුමතයේ දින පටන් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) යම් රීතියක් පරිච්ඡින්න කරන ලද සේ සැළකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථනිරූපනය.

88. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි:-

"අනතුර" යන්නෙන් බලාපොරොත්තු නොවූ සිදුවීමක් අදහස් කෙරෙන අතර, ඊට අදාළ සිදුවීමේ ප්‍රතිඵල හෝ ඇති විය හැකි ප්‍රතිඵල ආරක්ෂාව සහ ප්‍රවේසම අතින් සුළුපටු

නොවන, ක්‍රියාත්මක කිරීමේ දෝෂ, උපකරණ බිඳ වැටීම් සහ වෙනත් වැරදීම් ඇතුළත් වේ;

"අක්‍රිය කිරීම" යන්නෙන් ප්‍රවිකිරණ කාර්මික අනුආයතනයක මෙහෙයුම් කාලසීමාව අවසානයේ දී එහි ක්‍රියාකාරීත්වය අවසන් කිරීම පිණිස, සේවකයන්ගේ සහ මහජනයාගේ සෞඛ්‍ය තත්වය සහ ප්‍රවේසම සහ ප්‍රභවයන් ප්‍රවේසමින් ඉවත් කොට බැහැර කිරීම ඇතුළුව පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි නිසි සැළකිල්ලෙන් කරනු ලබන කටයුතු අදහස් වේ;

"සඵල මාත්‍රාව" එක් එක් පටකයෙහි පටක සමක මාත්‍රාව එම පටකයේ පටක භාර සාධකයෙන් ගුණකර, එම සියඵම පටක සමක මාත්‍රා එකතු කළවිට ලැබෙන මෙය **E** වලින් හැඳින්වෙන අතර

$$\mathbf{E} = \sum W_T H_T$$

මෙහි $H_T$ යනු T නම් පටකයක් තුළ සමක මාත්‍රාව ද $W_T$ යනු T නම් පටකය සඳහා වූ පටක භාර සාධකය ද වේ;

"නිරාවරණය" යන්නෙන් අයනීකාර විකිරණය මගින් ප්‍රවිකීරණයට පාත්‍ර වීමේ ක්‍රියාව හෝ තත්ත්වය අදහස් වන අතර එය බාහිර නිරාවරණය (ශරීරයෙන් පිටත ප්‍රභවයන්ගෙන් වන අයනීකාර විකිරණයෙන් ප්‍රවිකීරණය) හෝ අභ්‍යන්තර නිරාවරණය (ශරීරය ඇතුළත ප්‍රභවයන්ගෙන් වන අයනීකාර විකිරණයෙන් ප්‍රවිකීරණය) විය හැකි ය;

"පහසුකම" යන්නෙන් යම් ප්‍රවිකිරණ කාර්මික අනුආයතන, යුරේනියම් පතල් වැනි ඇතැම් කැණීම් හා අමු ද්‍රව්‍ය පිරිසැකසුම් ස්ථාන, විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණ ස්ථාන සහ ආරක්ෂාව සහ ප්‍රවේසම ගැන සැලකීම අවශ්‍යවන යම් පරිමාවකට විකිරණශීලී ද්‍රව්‍ය නිපදවන, පිරිසකසන, පාවිච්චි කරන, පාලනය කරන, ගබඩා කරන හෝ බැහැර කරන වෙනත් යම් ස්ථාන අදහස් වේ;

"පාරිසරික මාත්‍රා සමක සීඝ්‍රතාවය $\mathbf{H^*(d)}$" යනු දී ඇති කාලයක දී ICRU ගෝලයේ අරයක ඇති d ගැඹුරක දී ඉදියැවූ ක්ෂේත්‍රයට විරුද්ධ දිශාවට, අදාළ ඉදියැවූ සහ ප්‍රසාරිත ක්ෂේත්‍රය මගින් ප්‍රභූත වුන මාත්‍රා සමක ප්‍රමාණය වේ;

"දිශා මාත්‍රා සමක සීඝ්‍රතාවය" යනු දී ඇති කාලයක දී ICRU ගෝලයේ අරයක ඇති d ගැඹුරකදී නිරූපිත Ω නම් දිශාවකට අදාළ ප්‍රසාරිත ක්ෂේත්‍රය මගින් ප්‍රභූත වුන මාත්‍රා සමක ප්‍රමාණය වේ;

"විඛණ්ඩනය කළහැකි ද්‍රව්‍ය" යන්නෙන් යුරේනියම්-233, යුරේනියම්-235, ප්ලුටෝනියම්-239, ප්ලුටෝනියම්-241 හෝ

(අ) ස්වභාවික යුරේනියම් හෝ ප්‍රවිකීරණය නොකළ ඌන යුරේනියම්; සහ

(ආ) ස්වභාවික යුරේනියම් හෝ තාප ප්‍රතික්‍රියාකරනයක පමණක් ප්‍රවිකීරණය කරන ලද ඌන යුරේනියම්,

හැර ඉහත කී විකිරණ නියුක්ලයිඩ්වල යම් සංයෝගයක් අදහස් වේ;

"මහාධිකරණය" යනුවෙන් අමාත්‍යවරයා විසින් අග්‍රවිනිශ්චයකාරවරයාගේ එකඟතාව මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන, කොළඹ අධිකරණ කලාපයේ පිහිටි ශ්‍රී ලංකා මහාධිකරණය අදහස් වේ;

"සිද්ධිය" යන්නෙන් ක්‍රියාකරවීමේ දෝෂ, උපකරණ බිඳ වැටීම්, ආරම්භක සිදුවීම්, අනතුරු පෙර නිමිති, ආසන්න සිදුවීම් හෝ වෙනත් වැරදීම් හෝ ද්වේශ සහගත හෝ ද්වේශ රහිත අනවසර ක්‍රියා ඇතුළත් වන්නා වූ ද එකී සිදුවීම්වල ප්‍රතිඵල හෝ ඒවායින් ඇති විය හැකි ප්‍රතිඵල, අයනීකාර විකිරණයෙන් ආරක්ෂාව හෝ ප්‍රවේසම අතින් බලන විට සුළුපටු නොවන්නාවූ ද කවර හෝ අරමුණු නොකළ සිදුවීමක් අදහස් වේ;

"අයනීකාර විකිරණය" යන්නෙන් ජෛවීය ද්‍රව්‍යවල අයන යුගල නිපදවීමට හැකියාව ඇත්තාවූ විකිරණය අදහස් වේ;

"ප්‍රවිකීරණ උපකරණ" යන්නෙන් සාමාන්‍ය තත්ත්ව යටතේ නිරාවරණය වී ඇති කිසිදු මතුපිටකින් මිලි මීටර 50 ක දුරකදී පැයට මයික්‍රෝ ග්‍රේ 5 කට වැඩි අවශෝෂණ මාත්‍රා සීඝ්‍රතාවක් ඇති නොකරන කැතෝඩ කිරණ නලයක් පමණක් අඩංගු උපකරණයක් හෝ දෘශ්‍යමය ප්‍රදර්ශක

උපකරණයක්, හැර කිලෝ වෝල්ට් 5 කට වැඩි විභව අන්තරයක් මගින් රික්තකයක් තුළ ආරෝපිත අංශු ත්වරණය වීමට සලස්වන්නාවූ පද්ධති වේ. සියලු වර්ගවල එක්ස් කිරණ යන්ත්‍ර සහ ආරෝපිත අංශු ත්වරණයන් ප්‍රවිකිරණ උපකරණ වේ;

"ප්‍රවිකිරණ කාර්මික අනුආයතනය" යන්නෙන් අධික විකිරණ ක්ෂේත්‍රයක් ජනනය කළ හැකි ප්‍රබල විකිරණශීලී ප්‍රභවයක්, එක්ස් කිරණ උපකරණයක් හෝ අංශු ත්වරණ කාරකයක් සවිකොට ඇති ව්‍යුහයක් හෝ ස්ථාපනයක් අදහස් වේ. ආරක්ෂක ආවරණයක් සහ වෙනත් ආරක්ෂණයන් ද සපයන, අධික විකිරණ ක්ෂේත්‍රයකට අහම්බෙන් ඇතුළුවීමක් වලක්වන පරිදි අතරගුළු වැනි ආරක්ෂණ මෙවලම් සහිත උපකරණයන්ගෙන් නියුක්ත මනාව සැලසුම් කළ ස්ථාපනයක් බාහිර කදම්බ විකිරණ ප්‍රතිකාර විධි සඳහා වූ ස්ථාපන, කාර්මික නිෂ්පාදිත සංරක්ෂණය හෝ ජීවානුහරණය සඳහා වූ ස්ථාන සහ කාර්මික විකිරණ ලේඛනය සඳහා වූ ඇතැම් ස්ථාපන ප්‍රවිකිරණ කාර්මික අනුආයතනය යන්නට ඇතුළත් වේ;

"බලපත්‍රය" යන්නෙන් මේ පනතේ 19 වන වගන්තිය යටතේ නිදහස් කරන ලද ක්‍රියාපිළිවෙතක් නොවන ක්‍රියාපිළිවෙතක් පැවැත්වීම සඳහා බලය දෙමින් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් අදහස් වේ;

"බලපත්‍රලාභියා" යන්නෙන් බලපත්‍රයක් දරන්නකු අදහස් වේ;"

"අමාත්‍යවරයා" යන්නෙන් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පවරන ලද අමාත්‍යවරයා අදහස් වේ;

"න්‍යෂ්ටික ද්‍රව්‍ය" යන්නෙන් යම් ප්‍රභවයක්, ද්‍රව්‍යයක් හෝ යම් විශේෂ විඛණ්ඩනය කළහැකි ද්‍රව්‍යයක් අදහස් වේ;

"න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි තත්ත්වයක්" යන්නෙන් පහත සඳහන් හේතුවක් නිසා උවදුරක් ඇතිවන හෝ ඇති වෙතැයි සැළකෙන හදිසි අවස්ථාවක් අදහස් වේ;

(අ) න්‍යෂ්ටික දාම ප්‍රතික්‍රියාවකින් හෝ දාම ප්‍රතික්‍රියාවකින් ජනිතවන නිෂ්පාදිත ක්ෂයවීම නිසා පිටකරනු ලබන ශක්තිය; හෝ

(ආ) විකිරණ නිරාවරණය;

"න්‍යෂ්ටික ආයුධ" යන්නෙන් විඛණ්ඩනය හෝ විඛණ්ඩනය සහ වියලනය සංකේත වීමක් වන න්‍යෂ්ටික ප්‍රතික්‍රියාවකින් විනාශකාරී බලය ලබාගන්නා පුපුරන උපකරණයක් අදහස් වේ;

"අධි නිරාවරණය" යන්නෙන් යම් තැනැත්තකුට ලැබෙන මාත්‍රාව, නියම කරන ලද අදාළ මාත්‍රා සීමා ඉක්මවන ආකාරයට ඒ තැනැත්තා අයනීකාර විකිරණයට නිරාවරණය වීම අදහස් කෙරේ;

"අයනීකාර විකිරණය සම්බන්ධිත ක්‍රියා පිළිවෙත" යන්නෙන් මිනිසුන් නිරාවරණයට ලක්වීම හෝ ලක්වීමේ ඉඩකඩ හෝ නිරාවරණය වන මිනිසුන්ගේ ගණන වැඩි කෙරෙන අයුරින් අතිරේක නිරාවරණ ප්‍රභවයන් හෝ නිරාවරණ මාර්ගයන් ඉදිරිපත් කරන්නා වූ හෝ මිනිසුන් වැඩි ගණනකට නිරාවරණය ව්‍යාප්ත කරන්නාවූ හෝ පවත්නා ප්‍රභවයන්ගෙන් විහිදෙන නිරාවරණ මාර්ග ජාලය වෙනස් කරන්නාවූ මනුෂ්‍ය ක්‍රියාකාරකමක් අදහස් වේ;

"විකිරණ ආරක්ෂාව" යන්නෙන් අයනීකාර විකිරණයට නිරාවරණය වීමේ බලපෑමෙන් මිනිසුන් ආරක්ෂා කිරීම සහ මෙය ඉටුකරගැනීමේ උපක්‍රම අදහස් වේ;

"විකිරණ සේවක" යන්නෙන් තමා සේවයෙහි නියුක්තව සිටියදී, විකිරණයෙන් තමා ආරක්ෂාවන බව තහවුරු කිරීමේ වගකීම දරන සේවායෝජකයකු සඳහා පූර්ණ කාල, අර්ධ කාල හෝ තාවකාලික තනතුරක සේවය කරන යම් තැනැත්තකු අදහස් වේ;

"විකිරණශීලී ද්‍රව්‍ය" සහාවේ නියාමන පාලනයට යටත් අයනීකාර විකිරණය නිකුත් කරන ඕනෑම ද්‍රව්‍යයක් අදහස් වේ;

"විකිරණශීලී ප්‍රභවය" යන්නෙන් කැප්සූලයක් තුළ ස්ථිර ලෙස මුද්‍රා තබා ඇති හෝ ඝන ආකාරයෙන් සමීපව බද්ධ කළ සහ නියාමන පාලනයෙන් නිදහස් නොකළ විකිරණශීලී ද්‍රව්‍යයක් සහ විකිරණශීලී ප්‍රභවය කාන්දුවන හෝ බිඳුණු

එකක් නම් ඉන් මුදාහැරෙන යම් විකිරණශීලී ද්‍රව්‍යයක් ද අදහස් වේ;

"විකිරණශීලි අපද්‍රව්‍ය" යන්නෙන් ක්‍රියා පිළිවෙත් හෝ මැදිහත්වීම් වලින් ශේෂව ඇති කවර හෝ භෞතික ස්වරූපයක් දරන විකිරණශීලි ද්‍රව්‍ය අඩංගු නැතහොත් විකිරණශීලී ද්‍රව්‍ය වලින් අපවිත්‍ර වූ නියාමන පාලනයෙන් නිදහස් කිරීම පිණිස නියමිත මට්ටමට වැඩි විකිරණයක් හෝ විකිරණශීලී සාන්ද්‍රණයක් ඇති එමෙන්ම තවදුරටත් ප්‍රයෝජනයක් ඇතැයි නොසැලකෙන ද්‍රව්‍ය අදහස් වේ;

"ආරක්ෂණ ගිවිසුම්" යන්නෙන් 1984 අගෝස්තු මස 06 වන දින ක්‍රියාත්මක වූ න්‍යෂ්ටික ආයුධ පැතිරයාම වැළැක්වීමේ සම්මුතිය සහ එහි වෙනත් ප්‍රෝටකෝල සම්බන්ධයෙන් ආරක්ෂණ අදාල කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජ්‍යායතනය අතර ඇති කරගත් ගිවිසුම අදහස් වේ;

"ප්‍රවේසම" යන්නෙන් අයනීකාර විකිරණ අවදානම්වලින් මිනිසුන් සහ පරිසරය ආරක්ෂා කිරීම සහ විකිරණ අවදානම් ඇති කරන පහසුකම් සහ ක්‍රියාකරකම් ආරක්ෂා කිරීම අදහස් වේ;

"සුරක්ෂිතතාවය" යන්නෙන් න්‍යෂ්ටික හෝ වෙනත් විකිරණශීලි ද්‍රව්‍ය හෝ ඒවාට අදාල පහසුකම් සම්බන්ධිත සොරකම්, කඩාකප්පල් ක්‍රියා, අනවසර ඇතුළුවීම්, නීතිවිරෝධි පැවැරුම් හෝ වෙනත් ද්වේශ සහගත ක්‍රියා වැළැක්වීම සහ සොයාගැනීම සහ ඒවාට ප්‍රතික්‍රියා කිරීම අදහස් වේ;

"ප්‍රභවය" යන්නෙන් අයනීකාර විකිරණය පිට කිරීමෙන් හෝ විකිරණශීලි ද්‍රව්‍ය මුදාහැරීමෙන් විකිරණ නිරාවරණය ඇති කළ හැකි කවර වූ හෝ දෙයක් අදහස් වේ;

"ප්‍රභව ද්‍රව්‍ය" යන්නෙන් ස්වභාවයෙන් සිදුවන සමස්ථානික මිශ්‍රණයක අඩංගු යුරේනියම්, 235 හි හීන වූ යුරේනියම්, තෝරියම් සහ ඉහතකී කවර වූ හෝ දෙයක ලෝහ, මිශ්‍ර ලෝහ, රසායනික සංයෝගය හෝ සාන්ද්‍රණ සහ සභාව විසින්

කලින් කල තීරණය කරනු ලබන සාන්ද්‍රනයක වූ ඉහත කී දේවලින් එකක් හෝ වැඩිගණනක් අඩංගු වෙනත් යම් ද්‍රව්‍යයක් අදහස් වේ;

"විශේෂ විඛණ්ඩනය කළ හැකි ද්‍රව්‍ය" යන්නෙන් ප්ලුටෝනියම්-239, යුරේනියම්-233, සමස්ථානික-235 හෝ 233 හි වැඩි දියුණු කළ යුරේනියම්, ඉහත කී දේවලින් එකක් හෝ වැඩි ගණනක් අඩංගු යම් ද්‍රව්‍යයක් සහ සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන වෙනත් විඛණ්ඩනය කළ හැකි ද්‍රව්‍ය අදහස් කෙරෙන අතර ඊට ප්‍රභව ද්‍රව්‍ය ඇතුළත් නොවේ;

"සමස්ථානික 235 හෝ 233 හි වැඩි දියුණු කළ යුරේනියම්" යන්නෙන් සමස්ථානික 235 හෝ 233 හෝ ඒ දෙකම අඩංගු වන්නාවූ යුරේනියම් අදහස් වන අතර එසේ අඩංගු මේ සමස්ථානිකවල එකතුව සමස්ථානික 238 ට දරන අනුපාතය, සමස්ථානික 235 සහ සමස්ථානික 238 අතර ස්වභාවිකව ඇතිවන අනුපාතයට වැඩි විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**89.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## IV වන කොටස

### XIV වන පරිච්ජේදය

### ඉවත් කිරීම් සහ ඉතිරි කිරීම

1969 අංක 19 දරන පනත ඉවත් කිරීම සහ ඉතිරි කිරීමේ විධිවිධාන.

**90.** (1) 1969 අංක 19 දරන පරමාණුක බලශක්ති අධිකාරිය පනත (මෙහි මින්මතු "ඉවත් කළ පනත" යනුවෙන් හඳුන්වනු ලබන) මෙසේ ඉවත් කරනු ලැබේ.

(2) 1969 අංක 19 දරන පරමාණුක බලශක්ති අධිකාරිය පනත ඉවත් කරනු ලැබුව ද :-

(අ) නියමිත දිනයට පෙර දිනයෙහි ධුර දරමින් සිටි පරමාණුක බලශක්ති අධිකාරියේ සියලු සාමාජිකයන් නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි මණ්ඩලයේ සාමාජිකයන් බවට පත්වන ලෙස සැලකිය යුතු අතර අධිකාරියේ සාමාජිකයන් වශයෙන් ඔවුන් පත් කරනු ලැබුවේ යම් කාලයකට ද ඒ කාලයෙන් ඉතිරිව තිබෙන කාලය තුළ මණ්ඩලයේ සාමාජිකයන් ලෙස ධුර දැරිය යුතු ය;

(ආ) නියමිත දිනයට පෙර දින පරමාණුක බලශක්ති අධිකාරිය සතුව තිබුණු සියලු චංචල හා නිශ්චල දේපළ නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට අවස්ථාවෝචිත පරිදි මණ්ඩලය හෝ සභාව සතු විය යුතු ය;

(ඇ) පරමාණුක බලශක්ති අධිකාරිය විසින් හෝ එය සමඟ ඇතුළත්ව තිබුණු නියමිත දිනයට පෙර දිනයේ පැවති සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් නියමිත දිනයේ සිට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට අවස්ථාවෝචිත පරිදි මණ්ඩලය හෝ සභාව විසින් හෝ සමඟ ඇතුළත් වූ කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් බවට පත්වන ලෙස සැළකිය යුතු ය;

(ඈ) නියමිත දිනයට පෙර දිනයේ දී පරමාණුක බලශක්ති අධිකාරියේ අරමුදල්වල බැරට තිබුණු සියලු මුදල් අමාත්‍යවරයා විසින් තීරණයක් කරනු ලබන පරිදි අවස්ථාවෝචිත පරිදි මණ්ඩලයේ අරමුදලට හෝ සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය;

(ඉ) නියමිත දිනයට පෙර දින බලාත්මකව පැවති පරමාණුක බලශක්ති අධිකාරිය විසින් නිකුත් කරන ලද සියලු බලපත්‍ර සහ ඇතුළත් වූ අවබෝධතා කොන්දේසි හෝ සහයෝගීතා කොන්දේසි නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් අවස්ථාවෝචිත පරිදි මණ්ඩලය විසින් හෝ සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍ර හෝ ඇතුළත් වූ අවබෝධතා කොන්දේසි හෝ සහයෝගීතා කොන්දේසි ලෙස සැළකිය යුතු ය;

(ඊ) පරමාණුක බලශක්ති අධිකාරිය විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරනු ලැබ නියමිත දිනයට පෙර දිනයන්හි විනිශ්චයට භාජනව පැවති සියලු නඩු සහ නඩු කටයුතු නියමිත දිනයේ සිට අවස්ථාවෝචිත පරිදි මණ්ඩලය හෝ සභාව විසින් හෝ මණ්ඩලයට හෝ සභාවට විරුද්ධව හෝ පවරනු ලැබූ නඩු හා නඩු කටයුතු ලෙස සළකනු ලැබිය යුතු අතර ඒ අනුව පවත්වාගෙන ගොස් සම්පූර්ණ කළ හැකි ය;

(උ) නියමිත දිනකට පෙර දිනයේ දි පරමාණුක බලශක්ති අධිකාරියේ ධුර දරමින් සිටි නිලධරයන් සහ සේවකයන් අදාළ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ අවස්ථාවෝචිත පරිදි මණ්ඩලයේ හෝ සභාවේ කැමැත්ත ඇතිව නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන ලෙස පරමාණුක බලශක්ති අධිකාරියේ ඔවුන්ගේ සේවා නියුක්තයට අදාල කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන සේවා කොන්දේසි මත, අවස්ථාවෝචිත පරිදි මණ්ඩලයේ හෝ සභාවේ නිලධරයන් හෝ සේවකයන් වන බව සැළකිය යුතු ය;

(ඌ) පරමාණුක බලශක්ති අධිකාරියට පක්ෂව හෝ විරුද්ධව කරනු ලැබ නියමිත දිනයට පෙර දින අතෘප්තව පැවති සියලු නඩු තීන්දු සහ ආඥා නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයට හෝ සභාවට පක්ෂව හෝ විරුද්ධව කරන ලද නඩු තීන්දු සහ ආඥා වශයෙන් සැළකිය යුතු අතර ඒ අනුව බලාත්මක කරනු ලැබිය හැකි ය;

(එ) නියමිත දිනකට පෙර දින පැවති පරමාණුක බලශක්ති අධිකාරියේ සියලු සම්බන්ධකම්, අයිතිවාසිකම්, වත්කම්, බැදීම්, ණය සහ වගකීම් නියමිත දිනයේ සිට ඒ සම්බන්ධකම්, අයිතිවාසිකම්, වත්කම්, බැදීම්, ණය සහ වගකීම්වල විෂය කාරණයට අදාල කර්තව්‍යය හෝ කාර්යය මේ පනත යටතේ පැවරී ඇත්තේ කවරකුට ද යන පදනම මත අවස්ථාවෝචිත පරිදි මණ්ඩලයේ හෝ සභාවේ සම්බන්ධකම්, අයිතිවාසිකම්, වත්කම්, බැදීම්, ණය සහ වගකීම් ලෙස සැළකිය යුතු ය; සහ

(ඒ) ඉවත් කරන ලද පනත යටතේ සාදනු ලැබ නියමිත දිනයට පෙර දිනයේදී බලාත්මකව පැවති සහ මේ පනතේ විධිවිධානවලට අනනුකුල නොවන සියලු නියෝග නියමිත දිනයේ සිට මේ පනත යටතේ සාදන ලද නියෝග ලෙස සළකනු ලැබිය යුතු අතර, ඒ අනුව මේ පනත යටතේ සාදනු ලබන නියෝග වලින් සංශෝධනය හෝ ඉවත් කරනු ලැබිය හැකි ය.

**91.** (1) 1969 අංක 19 දරන පරමාණුක බලශක්ති අධිකාරිය පනත යටතේ පරමාණුක බලශක්ති අධිකාරිය විසින් නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම නියමිත දිනයේ සිට මාස 06 ක කාලය තුළ මේ පනතේ කාර්ය සඳහා වලංගු බලපත්‍රයක් ලෙස සැළකිය යුතු අතර ඒ බලපත්‍රලාභියා ඉන්පසුව මේ පනත යටතේ ක්‍රියා පිළිවෙතක් දිගටම පැවැත්වීමට අදහස් කරන අවස්ථාවක ඒ මාස හය ඉකුත්වීමට එක් මාසයකට අඩු නොවූ කාලයකට පෙර ඒ සඳහා යෝග්‍ය ඉල්ලුම්පතක් මේ පනත යටතේ සභාවට ඉදිරිපත් කළ යුතු ය.

1969 අංක 19 දරන පනත යටතේ නිකුත් කළ බලපත්‍ර වලංගු කිරීම සහ එහි ප්‍රතිඵල.

(2) නියමිත දිනකට පෙර 1969 අංක 19 දරන පරමාණුක බලශක්ති අධිකාරිය පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ යම් ක්‍රියාකාරකමක් හෝ ක්‍රියා පිළිවෙතක් කරගෙන යන සහ නියමිත දිනකට පසු ඒ ක්‍රියාකරකම හෝ ක්‍රියා පිළිවෙත නැවැත්වීමට හෝ දිගටම කරගෙන යාම නතර කිරීමට අදහස් කරන යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ සඳහන් හය මාසය ඉකුත්වීමට පෙර ඒ බව සභාවට නියමිත ආකෘතියෙහි දැක්විය යුතු ය. තව ද 33 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඊට සහ ඒ සම්බන්ධයෙන් අදාල විය යුතු ය.

## උපලේඛනය

**[6(4) සහ 14 (4) උපවගන්ති]**

### මණ්ඩලයේ සහ සභාවේ සාමාජිකයන්ට අදාල විධිවිධාන

(1) යම් තැනැත්තෙක් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් හෝ සභාවේ සාමාජිකයකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ දිගටම ක්‍රියාකිරීමට හෝ පහත සඳහන් අවස්ථාවල දී නුසුදුසු වන්නේය; එනම් ඒ තැනැත්තා:-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සාමාජිකයකු වීම;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසිකම අහිමිවීම;

(ඇ) යම් නීතියක් යටතේ බුන්වත් තැනැත්තකු හෝ නොම්දුනු බංකොළොත්කරුවකු ලෙස ප්‍රකාශයට පත් කරන ලද තැනැත්තකු වීම;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නීතිය යටතේ සිහිවිකල තැනැත්තකු වශයෙන් තීරණය කරන ලද හෝ ප්‍රකාශ කරන ලද තැනැත්තකු වීම;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් වරදකරුවකු කර තිබීම;

(ඊ) (i) සභාවේ සාමාජිකයකු වශයෙන් පත්කරනු ලබන අවස්ථාවේ දී ඒ වන විටත් මණ්ඩලයේ සාමාජිකයකු වී සිටීම; හෝ

(ii) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත්කරනු ලබන අවස්ථාවේ දී ඒ වන විටත් සභාවේ සාමාජිකයකු වී සිටීම;

(උ) සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කෙරෙන අවස්ථාවක එම තැනැත්තාගේ අවශ්‍යතා සහ සභාවේ කර්තව්‍ය හා කාර්ය අතර, යම් ගැටුමක් පැවතීම හෝ ගැටුමක් ඇතිවීමේ හැකියාවක් පැවතීම;

(2) මණ්ඩලයේ සාමාජිකයකු හෝ සභාවේ සාමාජිකයකු:-

(අ) මේ උපලේඛනයේ (1) වන ඡේදයෙහි සඳහන් නුසුදුසුකම් වලින් කිසිවකට යටත්වන විට;

(ආ) ඒ සාමාජිකයාගේ කාර්ය ඉටුකිරීමට ස්ථිර ලෙසම නොහැකි වන සේ යම් කායික දුබලතාවකට හෝ සිහි විකලබවට පත්ව ඇති බව අමාත්‍යවරයාගේ මතය වන විට;

(ඇ) අවස්ථාවෝචිත පරිදි මණ්ඩලය හෝ සභාව අවමානයට ලක් කළ හැකි යම් ක්‍රියාවක් කර ඇති බව අමාත්‍යවරයාගේ මතය වන විට; හෝ

අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා ධුරයෙන් පහ කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ හෝ සභාවේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු විසින් තත්කාර්ය සඳහා අමාත්‍යවරයාට යොමු කෙරෙන ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගන්නා දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) මණ්ඩලයේ හෝ සභාවේ සාමාජිකයකුගේ ධුරය:-

(අ) ඔහු හෝ ඇය මිය ගිය විට;

(ආ) සාමාජිකයා තම ධුරයෙන් ඉල්ලා අස්වීමට අදහස් කරන බව අමාත්‍යවරයාට ලිඛිතව දන්වන දිනයේ සිට දින හතක් ගත වූ විට සහ එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගත් විට;

(ඇ) ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට;

(ඈ) අවස්ථාවෝචිත පරිදි මණ්ඩලයේ හෝ සභාවේ සභාපතිවරයාට පූර්ව දැනුම් දීමකින් තොරව මණ්ඩලයේ හෝ සභාවේ අනුක්‍රමික සභා රැස්වීම් දෙකකට සාමාජිකයා නොපැමිණි විට; හෝ

(ඉ) සාමාජිකයකු වශයෙන් ඔහුගේ හෝ ඇයගේ ධුර කාලය අවසන් වූ විට;

හිස් විය යුතු ය.

(5) මණ්ඩලයේ හෝ සභාවේ පත්කළ සාමාජිකයකුගේ ධූරය හිස් වූ විට අමාත්‍යවරයා විසින් 6 (11) වගන්තියේ හෝ 13 (1) වගන්තියේ විධිවිධාන අනුව වෙනත් තැනැත්තකු, ඒ ධූරයට එය කලින් දැරූ තැනැත්තාගේ ධූරකාලයෙන් ඉතිරිව ඇති කාලය තුළ ධූරය දැරීම සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(6) (අ) අසනීපයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා මණ්ඩලයේ හෝ සභාවේ සාමාජිකයකුට ඔහුගේ හෝ ඇයගේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් අවස්ථාවෝචිත පරිදි මණ්ඩලයේ හෝ සභාවේ නිර්දේශය මත ඒ සාමාජිකයා නැති විට ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(ආ) මණ්ඩලයේ හෝ සභාවේ සභාපතිවරයාට අසනීපයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තාවකාලිකව තම කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් ඒ සභාපතිවරයා නැති විට සභාපතිවරයා වෙනුවෙන් ක්‍රියා කිරීමට මණ්ඩලයේ හෝ සභාවේ වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

(7) මණ්ඩලයේ හෝ සභාවේ සාමාජිකයන්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් ගෙවනු ලැබිය යුතු ය.

(8) (අ) අවස්ථාවෝචිත පරිදි මණ්ඩලය හෝ සභාව සෑම මාසයකදීම යටත් පිරිසෙයින් එක් වරක් හෝ අවශ්‍ය පරිදි වාර ගණනක් රැස්විය යුතු ය.

(ආ) මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු අතර සභාවේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතු ය.

(ඇ) මණ්ඩලයේ හෝ සභාවේ සියලු රැස්වීම්වල මුලාසනය මණ්ඩලයේ හෝ සභාවේ සභාපතිවරයා විසින් දැරිය යුතු අතර ඒ රැස්වීමකට සභාපතිවරයා පැමිණ නැති විට පැමිණ සිටින සාමාජිකයන් අතරින් යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා ගත යුතු ය.

(ඈ) මණ්ඩලයේ හෝ සභාවේ යම් රැස්වීමක දී සභාපතිවරයාට හෝ මූලාසනය දරන තැනැත්තාට තමාගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් හිමි විය යුතු ය.

(ඉ) මණ්ඩලය හෝ සභාව විසින් එහි රැස්වීම් පැවැත්වීම සහ රැස්වීමේ කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(9) මණ්ඩලයේ හෝ සභාවේ මුද්‍රාව :-

(අ) මණ්ඩලය හෝ සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට විය යුතු ය.

(ආ) මණ්ඩලය හෝ සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකු භාරයේ තිබිය යුතු ය.

(ඇ) මණ්ඩලය හෝ සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ඈ) යම් ලේඛනයකට හෝ සාධන පත්‍රයකට තැබීම මණ්ඩලයේ හෝ සභාවේ අනුමතය ඇතිව සහ මණ්ඩලයේ හෝ සභාවේ සභාපතිවරයා සහ වෙනත් එක් සාමාජිකයකු ඉදිරිපිටදී හැර නොකළ යුතු අතර ඒ දෙදෙනා විසින් තමන් සිටි බවට සාක්ෂි වශයෙන් ඒ ලේඛනයෙහි හෝ සාධන පත්‍රයෙහි අත්සන් කළ යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.